2026.06.09 වන දින සාමාන්‍ය රැස්වීම් වාර්තාව.
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ජුනි මස 09 වන දින පෙ.ව 9.30 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාවයි.

සහභාගීත්වය:-

01.ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

02. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා

03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. එච්. එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා

04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා

05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා

06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා

07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය

09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය

10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී. ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා

11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ. සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා

12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා

13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා

14.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

15.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය

16.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා

17.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය

18.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා

19.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා

20.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එල්. ජයසේකර මැතිතුමා

21.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා

22.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා

23.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා

24.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා

25.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය

26.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා

27.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා

28.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා

29.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

30.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී. ඒ. කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය

31.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා

32.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් චික්‍රමසිංහ මැතිතුමා

33.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. පී.ජේ.පී.හිරිපිටිය මැතිතුම

34. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

35.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්. ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා

36.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය

කාර්ය මණ්ඩලය

01. ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා	- ලේකම්
02. ජී.අයි.කේ.ජයතුංග මිය	- සංවර්ධන නිලධාරී
03. සී.චන්දිමා ප්‍රියදර්ශනී මිය	- සෞඛ්‍ය කම්කරු

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැමිණ සිටි මන්ත්‍රීරුන්, මන්ත්‍රීවරියන්, මාධ්‍යවේදීන්, සභා ලේකම්තුමා හා කාර්යාලයේ නිලධාරීන් දෙපළ පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

(අ) 2026.05.12 වන දින පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

2026.05.12 වන දින පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාව සභා සම්මත කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් 2026.05.12 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

2026.05.12 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව ගරු උපසභාපති යූ. එල්. එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.05.12 වන දින පවත්වන ලද සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.

එක නිවේදනයන් ලැබී තිබෙන බවත් එය මේ අවස්ථාවේ ඉදිරිපත් කරන බවත්. ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය. ඒ අනුව

රාජය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාතයාංශය, නිදහස් චතුරස්‍රය කොළඹ 07.2026.05.15.අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තුමේන්තු ප්‍රධානීන්, සංස්ථා හා සංස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,

රාජ්‍ය ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම. උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2025-04-02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2025 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02.එම චක්‍රලේඛයේ 2.1.2 වැනි උප වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

2.2.2(අ) සියලුම රාජ්‍ය ආයතනයන්හි තනි භාවිත ප්ලාස්ටික් වතුර බෝතල් මිලදී ගැනීම හා භාවිතය 2026-05-31 දින සිට සම්පූර්ණයෙන් නතර කළ යුතු වේ.

(ආ) පහත සඳහන් ගැසට් පත්‍ර මගින් භාවිතය තහනම් කර ඇති තනි භාවිත ප්ලාස්ටික් ඔබ ආයතනය තුළ භාවිතයෙන් වැළැක්වීම සඳහා සියලුම ආයතන ප්‍රධානීන් අවශ්‍ය කටයුතු කළ යුතු වේ.

(i) අංක 2341/30 දරන 2023.07.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය

(ii) අංක 2034/37 දරන 2017.09.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය

03.තවද,2025.04.02 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2025 හි සඳහන් අනෙකුත් විධිවිධාන තවදුරටත් බලාත්මක වේ.

04.මෙම චක්‍රලේඛය පරිසර අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

අත්සන් කළේ, ආලෝක බණ්ඩාර ලේකම්, රාජය පරිපාලන පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය.**තනි භාවිත ප්ලාස්ටික් බෝතල් භාවිතය තහනම් කර ඇති බවත්, ඊළඟ සභාවාරයේ සිට මේ සම්බන්ධව තීරණයක් ගත යුතු බවත්**

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(ඇ) සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.

කිසිවක් ලැබී නැත.

(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.

කිසිවක් ලැබී නැත.

(ඉ) යටා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් නැත.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා**.**

ගරු සභාපතිතුමනි, 2026-05-23 වන දින සභා ලේකම්තුමා හට කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් හෝ කවුරුන් හෝ බලපෑම් සිදු කළ බව නිල වට්ස්ඇප් ගෘප් එකෙහි සඳහන්ව තිබූ බවත්, ඒ අනුව සභා ලේකම්වරයාට කුමන හෝ ගැටළුවක් ඇතිව තිබෙනවා නම් එය අපටද ගැටළුවක් වන බවත්, එය නිවැරදි කර ගෙන ඉදිරියට යාම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. වරිපනම් ලබා ගන්නා එක සඳහා කවුරුන් හෝ බලපෑම් සිදු කරලා ද එය සාධාරණ ද අසාධාරණ ද කියා ගෘප් එකෙනුත් විමසුව ද මේ වන තෙක් පිළිතුරක් නොලැබුණ බවත්, එය නිවරදි කර ගෙන සභාව ඉදිරියට පවත්වාගෙන යා යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙවැනි ප්‍රශ්න තිබේ නම් යටා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ ඉදිරිපත් කළ යුතු බවත්, මේ සම්බන්ධව පෙර දිනකදී ද දැනුවත් කළ බවත්, මෙවර න්‍යාය පත්‍රයට මේ සම්බන්ධව යෝජනාවක් ඇතුළත් වී නොමැති බැවින්, මේ අවස්ථාවේ ඒ සම්බන්ධව සාකච්ඡා කළ නොහැකි බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(ඊ) යටා පරිදි කල් දී ඇති යෝජනා.

01 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

පසුගිය සභාවල සහ දැනට සභාවේ සිටින මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා මියගිය පසු ආදාහනාගාරයේ ආදාහන කටයුතු නොමිලේ සිදු කර දීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා යම් යම් තීරණ ගැනීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් ගරු මන්ත්‍රීතුමන්ලා වශයෙන් මෙහි පැමිණ සිටින බවත්, ගරු මන්ත්‍රීතුමන්ලාහට යම් කිසි වරප්‍රසාදයක් ලබා ගැනීමේ අරමුණින් මෙම යෝජනාව ඉදිරිපත් නොකළ බවත්, අදාළ නොවන ගරු මන්ත්‍රීවරයාට එම ගෙවීම් කටයුතු සිදු කර සිදු

කිරීමට හැකි බවත්, වසර 10 ක් 15කට වැඩි කලක් ගම් ප්‍රදේශ දියුණු කර වයෝවෘද්ධව රෝගාතුරව සිටින හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා සහ වර්තමානයේ යම් කිසි සේවාවක් සිදු කරන ගරු මන්ත්‍රීතුමන්ලාගේ සේවය වෙනුවෙන් හා ඔවුන් සේවයක් ඉටු කළා ද නැද්ද යන්න කාරණය පිළිබඳව ජනතාවට යම් කිසිදු අවබෝධයක් නොමැති විට කවදා හෝ ඔවුන් වෙනුවෙන් ප්‍රාදේශිය සභාවක් ලෙස සිදු කළ හැකි ගෞරවනීය සේවාවක් ලෙස මෙම යෝජනාව ඉදිරිපත් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.

ගරු සභාපතිතුමනි, ජාතික ජනබලවේග ආණ්ඩුව වර්තමානයේ පවතින බවත්, දේශපාලනයේ නාස්තිකාර තීරණ වියදම් අඩු කර ප්‍රතිපත්තිමය තීරණයක් රැගෙන ඇති බවත්, ජනාධිපතිවරුන්ගේ හා වැන්දඹුවරුන්ගේ වරප්‍රසාද අහෝසි කිරීමටත්, ඒ යටතේ නිල නිවාස හා නඩත්තු වියදම් අහොසි කිරීම, ජීවිත කාලය පුරා ම නිල නිවාස භාවිත කරමින් නඩත්තු වියදම් දරා ගෙන සිටි හැත්තෑ අවුරුද්දක් තිබූ බවත්, අමතර වාහන සහ ඉන්ධන දීමනා අහෝසි කර ඇති බවත්, ඒ අනුව ජනාධිපතිවරු සතුව තිබූ අධික වාහන සංඛ්‍යාව සීමාකර අමතර වාහන රජයට පවරා ගෙන ඇති බවත්, චක්‍රලේඛනයක් අනුව ජනාධිපතිවරුන්ට හා ඇමතිවරුන්ට වාහන දෙකක් පමණක් තබා ගැනීමට අවසර ලබා දී ඇති බවත්, පසුගිය සභාවල සිටි සහ දැනට සභාවේ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මියගිය පසු ආදාහනාගාරයේ ආදාහන කටයුතු නොමිලයේ සිදු කිරීම සඳහා දැනට යෝජනා කර ඇති බවත්, ජාතික ජන බලවේග ආණ්ඩුවක් පත් වුයේ ජනතාවට නොමැති වරප්‍රසාද අපි විසින් ද භුක්ති විඳින් නෑ කියන පරමාර්ථයෙන් බවත්, ජනතාවාදී ආණ්ඩුවක් හැටියට සභාවක් විදිහට මේ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් හදා දෙන තැන දී පමණක් මෙවැනි යෝජනා ක්‍රියාත්මක කළ යුතු බවත්, ඒ අනුව ජනතාවාදී ආණ්ඩුවක් ලෙස මෙය දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

යෝජනාවට ඉතා කෙටියෙන් ඊට අදාළව පමණක් අදහස් දක්වන ලෙස ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කළ පරිදි මහජනතාවට නොමැති කිසිදු වරප්‍රසාදයක් අප විසින් භුක්ති නොවිඳින බවත්, නමුත් ඇත්තට ම එසේ නොවන බවත්, අද රටේ ජනාධිපතිතුමාගේ සිට පහළට ගත් විට මහජනතාවට නැති වරප්‍රසාද භුක්ති විඳින් නැතිව සිටින් නැති බවත්, එබැවින් මෙය කාටත් යහපතක් වන යෝජනාවක් බැවින් මෙම යෝජනාව ක්‍රියාත්මක වීම සියලු දෙනාටම යහපතක් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ මහජන ඡන්දයෙන් තේරී පත්ව පැමිණි මහජන නියෝජිතයන් ලෙස අපගේ අරමුණ විය යුත්තේ මහජන සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීම බවත්, පනතේ තිබෙන ප්‍රධාන ම දෙය එය බවත්, මහජන නියෝජිතයින් ලෙස පැමිණ අපේ සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු සිදු කරනවා නම් එය පක්ෂ භේදයකින් තොරව සියලු දෙනා ම මන්ත්‍රීවරුන් විදිහට පනත සම්බන්ධව හොඳ අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතු බවත්, දැනට අපේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් වී ඇති බවත්, මීට කලින් ජනතාව දේශපාලඥයාව දේවත්වයෙන් අදහනු ලැබූ බවත්, විවිධ ආකාරයෙන් දේශපාලකයා ගාම්භීර ආකාරයකට ගොඩනැගුන එම දේශපාලන සංස්කෘතිය අවසන් බවත්, ඒ අනුව ජන මනසට විරුද්ධව කටයුතු කළ නොහැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමාලගෙ දේශපාලනය තාම ඒ තැනට නොපැමිණ ඇති බවත්, ඒ තැනට පැමිණෙන ලෙස ආරාධනා කරන බවත්, කොළඹ

මහනගර සභාව ගැන කතා කළ බවත්, එහි ආදාහනාගාර පහසුකම ලබා දෙන්නේ සියලුම පුරවැසියන්ට බවත්, එවැනි කාලයක් ඇහැලියගොඩට ආවොත් ඒ තත්ත්වය ලබා දෙන බවත්, මෙය සම්මත වුවහොත් ඇහැලියගොඩ සභාව සභාවක් ලෙස ඉතාමත් ම අපකීර්තියට පත් වන බවත්, ඒ නිසා දේශපාලන විඥානය වෙනස් කර ගෙන අලුත් තත්වයට හැඩ ගැසෙන ලෙස ආරාධනා කරන බවත් සඳහන් කරමින් මෙම යෝජනාව සඳහා ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව හැකියාවක් තිබේ නම් මන්ත්‍රිවරුන්ට මන්ත්‍රිවරියන්ට පමණක් නොව මේ ප්‍රදේශයේ සිටින සියලුම දෙනාට ලබා දෙන්න පුළුවන් නම් එය හොඳ කාරණාවක් බවත්, මීට මාස කිහිපයකට පෙර කොළඹ නගර සභාවේ කොමසාරිස්තුමා විසින් තීන්දුවක් ගෙන ඒ ප්‍රදේශයේ ජනතාවට නොමිලේ ආදාහන කටයුතු සිදු කිරීමට තීන්දුවක් ගත් බවත්, ඒවගේ තැනකට අපේ සභාවත් ඉදිරි කාලයේදී රැගෙන යෑමට හැකි නම් හොඳ තත්ත්වයක් ඇති කර ගත හැකි බවත්, ඒ තුළින් ජනතාවට සහනයක් ලබාදීමට හැකිවන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් තම පෞද්ගලික අදහස ලෙස, මේ යෝජනාව සම්මත වුවා හෝ නොවුවා, මේ යෝජනාව සම්මත වුවත් මේ අවස්ථාව තමා විසින් ලබා නොගන්නා බවත්, තමාගේ පියා 1991 සිට වසර 25 ක් අඛණ්ඩව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව නියෝජනය කළ බවත්, එතුමා සඳහා ද ඒ අවස්ථාව ලබා ගැනීමේ බලාපොරොත්තුවක් නොමැති බවත්, එය තමාගේ පෞද්ගලික අදහසක් බවත්, මේ යෝජනාව මන්ත්‍රිවරුන්ට පමණක් නොව නිලධාරින්ට ද මේ ප්‍රදේශයේ ජීවත් වන හැත්තෑ පන්දහසකට ආසන්න පිරිසක් ජීවත් වන බවත්, නමුත් මියගිය සියලු දෙනා ගෙනවිත් ආදාහනාගාරයේ ආදාහනය සිදු නොකරන බවත්, දිනකට ආදාහන තුනක් පමණක් සිදු කරන බවත්, එම ආදාහන තුන නොමිලේ කරන්න පුළුවන් තත්ත්වයකට අපේ සභාව ගෙන යා හැකි නම් ඒ සඳහා තමා එකඟ වන බවත්, එසේ වුවහොත් සියලු දෙනාටම එය හිමිවන නිසා බවත්, අපට හැකියාවක් තිබේ නම් සභාවේ ආර්ථිකය ස්ථාවර කර ගෙන සියලුම දෙනාට ලබා දෙන්න පුළුවන් තත්ත්වයට රැගෙන යා යුතු බවත්, මේ යෝජනාව සම්මත වුවත්, තමාට හෝ තමාගේ පියාට ඒ අවස්ථාව අනවශ්‍ය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ගෙනා යෝජනාවේ පදනම තමන් හරියට ම නොදන්නා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා කළ ප්‍රකාශත් සමඟ විහිළුවක් කරනවාද යන්න තමන් සිතන බවත්, අපි මිනිසුන්ට සලකිය යුත්තේ මැරුණට පසුව නොව ජීවත් වී සිටින විට බවත්, කැමවත් සපයා ගත නොහැකි මන්ත්‍රිවරු සිටින බවත්, ඒ අය පිළිබඳව කවුරුවත් කතා කර බලනවාද යන්නත්, එහෙම නැතුව මැරුණට පසුව මිනිය ආදාහනය කිරීමට පමණක් යෝජනාවක් ගෙන ඒම කාලෝචිත නොවන බවත්, මිනිසුන්ට කන්න නැත්නම් මන්ත්‍රිවරු කාලා වැඩක් නැති බවත්, අපේ ප්‍රතිපත්තිය එය නොවන බවත්, ඒ නිසා මෙය කතා කළ යුතු මාතෘකාවක් නොවන බව තමන් සිතන බවත්, මන්ත්‍රිවරුන් ලෙස තමන් වරප්‍රසාද බලාපොරොත්තුවෙන් සිටින කණ්ඩායමක් නොවන බවත්, මරණයේදී පමණක් සැලකීම අනවශ්‍ය බවත් ජීවත්ව සිටියදී සෑම අයෙක් දෙසම බැලිය යුතු බවත් මේ සඳහා අය කරනු ලබන මුදලේ ප්‍රමාණය අඩු කිරීම සඳහා සලකා බැලීම වඩා වැදගත් බවත්, මෙ හිටපු මන්ත්‍රිවරුන්ට හා ඉන්න මන්ත්‍රිවරු මිය ගිය පසු මේ කරන ක්‍රියාව තේරුමක් ඇති ක්‍රියාවක් නොවන බවත්, මෙම යෝජනාව සමාජගතවීමේදී මිනිසුන්ගෙන් දෝෂාරෝපණ පැන නැගිය හැකි බවත්, මේ සඳහා බෙදීමකට යා යුතු නම් ඒ සඳහා කටයුතු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, දේශපාලනයයි සංස්කෘතියයි ශිෂ්ඨ සම්පන්න පැත්තක් කරා යොමු වන විට මන්ත්‍රිවරයෙකුට කියා තනිව වරප්‍රසාද භුක්ති විඳීමේ අවශ්‍යතාවක් නොමැති බවට තමන් ද දකින බවත්, ඒ නිසා මෙම යෝජනාව කණ්ඩායමක් ලෙස සාකච්ඡා කර ඉදිරිපත් කළ යෝජනාවක් නොවන නිසා බෙදීමකට නොයා සාකච්ඡා කර තීරණයක් ගත යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව තමා ගෙන ආවේ අපට වරප්‍රසාද ලබා නොගැනීමට බවත්, උපසභාපතිතුමා විඥානය ගැන කතා කළ බවත්, මේ විඥානය ගැන තමා ප්‍රශ්න කරන බවත්, මේ විඥානය ධර්මානුකූල විඥානයක්ද

කියන එක තමන් අසන බවත්, අපිට මේ වරප්‍රසාද ගැනීමට තමන් කතා නොකළ බවත්, මේ සම්බන්ධව තමන් පැහැදිලි කිරීමක් සිදු කළ බවත්, අවශ්‍ය නැති අයට අයින් වෙන්න පුළුවන් බවත්, යෝජනාව යොමු කිරීමට පෙර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා සමඟ කතා කළ බවත්, සභාපතිතුමා සමඟත් කතා කළ බවත්, ඒ අවස්ථාවේ කිසිවක් ප්‍රකාශ නොකළ බවත්, (ඝෝෂාව) ඒ අවස්ථාවේ තමාට එය යොමු කරන්න එපා කියා ප්‍රකාශ කළා නම්, තමා මේ යෝජනාව සභා න්‍යාය පත්‍රයට යොමු නොකරන බවත්, (ඝෝෂාව) මීට පෙර ඇහැලියගොඩ ඔසුසලක් අවශ්‍යයි කියා තමා විසින් යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ බවත්, එය විෂය පථයට අදාළ නොමැති බව කියා එම යෝජනාව ප්‍රතික්ෂේප කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම අස්ගගුලේ බිසෝදොළ තිබෙන්නේ උතුරු ග්‍රාම නිලධාරී වසමේ ද දකුණු ග්‍රාම නිලධාරී වසමේ ද කියා තමන් විසින් විමසා සිටින බවත්, එම ස්ථානයේ ස්ථාපිත කර ඇති බෝර්ඩ් එකෙහි සඳහන් කර ඇත්තේ අස්ගගුල දකුණ ග්‍රාමසේවා වසම ලෙස බවත්, බිසෝදෙල කියා එම බෝඩ් එකෙහි සඳහන් වන බවත්, එය බිසෝදොළ විය යුතු බවත්, හතර මායිමෙන් පටන් ගන්න නම්, හතර මායිම් දැන ගෙන සිටිය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පිරිත් සහ දානමය පිංකම සඳහා ඉතාමත් සද්භාවයෙන් එම කටයුතු සඳහා තමන් සහභාගී වූ බවත්, මින් ඉදිරියට සභාවේ කටයුතු කරන ආකාරයත් පැහැදිලි කරන බවත්, මෙතැන් පටන් විපක්ෂයේ කාර්යභාරය තමන් විසින් ඉටු කරන බවත් ඒ අනුව මෙම යෝජනාව තමන් විසින් ඉල්ලා අස්කර ගන්නා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, විෂය පථය කිවුවහම අපට අයිති වන්නේ පළාත් පාලනය සම්බන්ධව 1987 අංක 15 දරන පනත. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය පටන් ගත්තේ ද අපට අවශ්‍ය නැති තැනකින් බවත්, අපට අයිති මේ වසම් 44 ට කටයුතු කරන්න බවත්, තම ඉතිහාසය අනුව ද තමාගේ පියා දේශපාලඥයෙක් නොවන බවත්, නමුත් ගම තුළ අවමංගල්‍ය කටයුත්තක් සිදු වූ විට එම මිනිසුන් හට අවශ්‍ය සේවය සපයා දුන් බැවින්, තමන් දේශපාලනඥයෙක් වූ බවත්, ඒ අනුව මෙම ගරු මන්ත්‍රීතුමන් ද බොහොම සද්භාවයෙන් මෙම යෝජනාව ගෙන ආ බවත්, එතුමා ඒ යෝජනාව ගෙනාවේ අපේ මේ ඉන්න 36 දෙනාටවත් නොවන බවත්, එහෙම අපහසුතා තිබෙන මන්ත්‍රිවරු සිටින බවත්, ඒ නිසා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා විසින් ඒ යෝජනාව ගෙන ආ බවත්, මන්ත්‍රිවරයෙකුට ඕන යෝජනාවක් විෂය පථය ඇතුළත ගෙන ආ හැකි බවත්, එතුමා ඒ යෝජනාව ඉල්ලා අස් කර ගත් නිසා ඒ සඳහා වාද විවාද කළ යුතු නැති බවත්, ආගමික උත්සවයේදී පවා එතුමා සද්භාවයෙන් මහන්සි වී සහභාගී වූ බවත්, එම යෝජනාව එතුමා හදවතින්ම ගෙන ආ බවත්, වසරක් ගත වී ඇති පවතින රජය සඳහා තව වසර තුනක් ඉතිරිව ඇති බවත් ඒ සඳහා ආණ්ඩුවේද සහයෝගයද ලබා ගෙන ඉදිරියට කටයුතු සිදු කර ගෙන යමු කියා යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා ඉතාමත් සද්භාවයෙන් මෙම යෝජනාව ගෙන එන්නට ඇති බවත්, නමුත් දැනට වැඩිම මුදලක් ආදාහනයක් සඳහා අයකරනු ලබන්නේ මෙම ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව බවත්, ආදාහනයක් සඳහා අය කරන මුදල කුරුවිට, දෙහිඕවිට, ගම්පහ දිස්ත්‍රික්කයේ ගොඩක් ම අඩු බවත්, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මේ අවට සෑම ප්‍රදේශයකම අඩු මුදලක් අය කරනු ලබන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේවන විට සියලුම ජනතාව ආර්ථික වශයෙන් දැඩි අපහසුතාවයකට ලක්ව ඇති මොහොතක එම සහන මිනිසුන් හට ලබාදීමේ ක්‍රමවේදයක් සඳහා යාමට මෙය අවස්ථාවක් කර ගත යුතු බවත්, දැනට අය කරන රුපියල් 15000.00 ක මුදල

රුපියල් 12000.00 ක් දක්වා වත් අඩු කළ යුතු බවත්, සුසානාගාරයෙන් අපේක්ෂා කරන්නේ සුභසාධනයක් බවත්, ආදායම් උත්පාදනය කරන ව්‍යාපෘතියක් ලෙස එය පත් නොකරගත යුතු ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේ පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා තමා සමඟ කතා කළ බවත්, මේ සම්බන්ධව මන්ත්‍රී කණ්ඩායම සමඟ වැඩිදුර සාකච්ඡා කිරීමට නොහැකි වූ බවත් ඒ සඳහා තම කණගාටුව පළ කර සිටින බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.විත්තක කරුණාරත්න මැතිතුමා පෙ.ව 10.05 ට සභා ගර්භයෙන් පිට විය.

02 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.

හපුගස්වත්ත මාර්ගයට හැරෙන පොදු ළිඳ ළඟ සිට එච්.ජී ප්‍රේමදාස මහතාගේ නිවස අසලට මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ හැකි ද නොහැකි ද යන්න පිළිබඳව තමාට පැහැදිලි අවබෝධයක් තාම නැති බවත්, ඒ සම්බන්ධව ගෙන ඇති තිරණය විමසා සිටින බවත්, තමන් සිටින්නේ ඉදිරිපත් කළ හැකිය යන්න මතයේ බවත්, නමුත් ලේකම්තුමන් විසින් සභාවේ කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීම සඳහා මින් ඉදිරියට සංවර්ධන යෝජනා ඉදිරිපත් නොකරන ලෙස ඉල්ලා සිටියද, මෙම වසර පුරාවට සතර වතාවක් එම මතය වෙනස් කළ බැවින් ස්ථිරව ම අසා සිටින්නේ සංවර්ධන යෝජනා න්‍යාය පත්‍රයට ඉදිරිපත් කළ හැකිද නොහැකිද යන්න බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසන ලදී. මෙම මතය ඉදිරියට ගෙන යා යුතු නිසා හිඳුරංගල යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමට සිදු වූ බවත්, වසරක් ගත වුවත් මෙම ගැටළුවට විසඳුමක් නොලැබුණ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ලක්ෂ 01ක හා 02ක පමණක් වන යෝජනා ඉදිරිපත් කර අනෙක් යෝජනා ප්‍රතික්ෂේප කරමු ය යන අදහසේ සිටින බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා පෙ.ව 10.10 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි , එය සභාවකින් තීරණය කළාද. ගරු සභාපතිතුමන් විසින් සියලුදෙනාම දැනුවත් කළා ද නැද්ද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසන ලදී. මේ සම්බන්ධව තමාට අසාධාරණයක් පෙනෙන බවත්, සභාපතිතුමා හිතේ තියාගෙන සිටින බවත්, ලේකම්තුමා සමඟ ආණ්ඩු පක්ෂයේ අය සමඟ සාකච්ඡා කරන්න ඇති බවත්, නමුත් සංවර්ධන

යෝජනාවල සීමාව කියක් ද කියා තමා නොදන්නා බවත්, ජනතාව සංවර්ධන යෝජනා ගෙනැත් දුන් විට ඒවා යොමු කරන බවත්, මේවා ක්‍රියාත්මක වෙනවද නැද්ද, මේවා න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න පුළුවන් ද බැරිද යන්න තමන් දන්නැති බවත්, න්‍යාය පත්‍රයට සභා යෝජනා ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසත්, හැමදාම ඉල්ලිම් කරන්නේ ඒ සම්බන්ධව බවත්, නොයෙසේනම් නිශ්චිත සීමාවකට යටත් ව මේ සභාව තුළ තීරණයක් ගත යුතු බවත්, මෙය තමාට

ගැටලුවක් බවත්, හිඳුරංගල යෝජනාවට එක්තරා අවස්ථාවක විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමට සිදු වූ බවත්, ඒ සංවර්ධන යෝජනාවට විරුද්ධ නිසා නොව මේ මතය ඉදිරියට ගන්න ඕන නිසා එය කිරීමට සිදු වූ බවත්, අවුරුද්දක් ගත වුවත් මේ යෝජනා සම්බන්ධව ස්ථීර තිරණයක් ගෙන නොමැති බවත්, අද දින මේ සඳහා තීරණයක් ගත යුතු බවත්, සංවර්ධන යෝජනා දාන්න දෙනවද නැද්ද, දාන්න දෙනව නම් ඒ සම්බන්ධව කුමක් හෝ සීමාවක් තිබේද? මෙම සංවර්ධන යෝජනා එක් රැස්වීම තුළ සභාවේ කාර්යක්ෂමතාවය තුළ නිලධාරීන්ට ප්‍රශ්නයක් වෙනවාද? ඵලදායීතාවය අඩු වෙනවාද? විපක්ෂයේ කණ්ඩායමට ලක්ෂ 24ක් දෙන බවට එකඟතාවයකට පැමිණියද ඒ පිළිබඳවද තවම අවසන් තීරණයක් නොමැති බවත්, ඒකාබද්ධ කාරක සභාවේදී ප්‍රකාශ කළේ එය අවසන් තීරණය කියා බවත්, දැඩි විශ්වාසයකින් ගම තුළ සිටින මිනිසුන් හටද ඒ පිළිබඳව පැවසූ බවත්, මේවන විට එම ලක්ෂ 24 පිළිබඳව කතිකාවතක් නොමැති බවත්, සංවර්ධන යෝජනා ගැන පිළි ගත් ක්‍රමවේදයක් නොමැති බවත්,ලක්ෂ 2 අඩු ඒවා පමණක් දැමූ බවට සභාපතිතුමා දැන් ප්‍රකාශ කරන තුරු නොදන්නා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ ද ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් නොමැති බවත්, මුලින් සම්මත වූ යෝජනා සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, 2026 වර්ෂය සඳහා අයවැය වාර්තාව සැකසූ බවත්, ඒ අයවැය යෝජනාවේ උපරිම සීමාව ද ඉක්මවා යෝජනා දෙසිය හැත්තෑ ගණනක් මේ වන විටත් පවතින බවත්, ඒ සියලු දෙනා ස්වයං පාලනයකට යායුතු බවත්, මෙම න්‍යාය පත්‍රයටද යෝජනා 20ක් 25ක් පමණ ඉදිරිපත් වූ බවත්, ලේකම්තුමන් විසින් එම සියලු දෙනාටම දැනුම් දෙනු ලැබුවේ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් මෙම සංවර්ධන යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කළ නොහැකි බව කියා බවත්, මෙහි සත්‍ය කරුණ නම් මෙම යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කළ පසු සභාවේ එය කතා කළ බවට ජනතාවට පැවසිය හැකි බැවින් යෝජනා ඉදිරිපත් කරන බවත්, අප සියලු දෙනාම එය සිදු කරන බවත්, විමධ්‍යගත ප්‍රතිපාදන හා පළාත් සභා ප්‍රතිපාදන ලැබෙන බවත්, ප්‍රාදේශිය සභා ප්‍රතිපාදන මත මේ සියල්ල කළ නොහැකි බවත්, සභාව විධිමත්ව පවත්වා ගෙන යැමට සහයෝගය ලබා දෙන ලෙසත්, නව ලේකම්තුමා පැමිණි පසු පෙර පැවති දීර්ඝ වාර්තාව ඉතාමත් කෙටි වූ බවත් එය යහපත් කරුණක් බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මනත්‍රිවරු සාකච්ඡා කර විසඳුමකට පැමිණිය යුතු බවත්, සීමාවක් ඇත්නම් එම සීමාව නිශ්චිතව සඳහන් කර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා පමණක් යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව නොදෙන ලෙසත්, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව ආණ්ඩු පක්ෂයේ අයට පමණක් සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම අවස්ථාව ලබා දෙන බවත්. විපක්ෂය මර්දනය කර ඇති බවත්, මෙය මාධ්‍යයේද වාර්තා විය යුතු කරුණක් බවත්, මෙම කරුණ නිශ්චිත නොවූ විට සෑම දිනම ගැටළු මතුවන බැවින් අද දින සාකච්ඡා කර විසඳුමක් ලබා ගත යුතු බවත්, තමන් අකමැත්තෙන් වුව ද යෝජනා නොදැමීමට එකඟතාවයකට පැමිණෙන බවත්, යෝජනා නොදමන බවත්, සමහරවිට මේ සභාවට නොපැමිණෙන බවත්, මිනිසුන්ගේ ප්‍රශ්න කතා කිරීමට තිබෙන ස්ථානය මේ ස්ථානය බවත්, එක්කොා යෝජනා දාන්න එපා කියන බවත්, නැත්නම් සභාවට අදාළ කාරණාවක් නොවන බව ප්‍රකාශ කරන බවත්, ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළ කරුණ සභාවට අදාළ නොවන්නේ කෙලෙස ද කියා තමන්ට ගැටළුවක් බවත්, ආණ්ඩුවේ ප්‍රතිපත්තිය පිළිබඳව මෙම සභාවේ එතුමිය කතා නොකර වෙන කුමන ස්ථානයක කතා කරන්ද යන්න තමන් විමසා සිටින බවත්, ආණ්ඩුවේ ප්‍රතිපත්තිත් සමඟ සභාවේ තිරණ ගත යුතු බවත්, ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සෑම දෙනාට ම එක හා සමානව සලකනව නම් , ඒ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මේ අවස්ථාවේ ප්‍රකාශ කර මෙය වැරදියි කියා ප්‍රකාශ කළ යුතු බවත්, යෝජනා ඉදිරිපත් කරනවාද නැද්ද කියා අවසන් තීරණයකට පැමිණිය යුතු බවත්, යෝජනා යොමු කරනවා නම්

එහි සීමාව කෙසේද යන්න පිළිබඳව තිරණයකට එළඹිය යුතු බවත්, ලේකම්වරයා මාරු වන විට ස්ථාවරත්වය වෙනස් වන බවත්, එසේ නොවිය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැනිණිය විසින් ගෙන ආ යෝජනාව මීට පෙර තමන් විසින් 2025-10-14 වන දින ගෙන ආ යෝජනාවක් බවත්, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස තම ඉල්ලීම වනුයේ එම යෝජනාව ක්‍රියාත්මක කළ යුතු බවත්, තම අවශ්‍යතාවය වනුයේ බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ කුමන හෝ සංවර්ධන කටයුත්තක් සිදුවීම බවත් විපක්ෂ මන්ත්‍රීවරයෙක් විසින් මෙම යෝජනාව ගෙන ආවත් ඉටු නොවූ බැවින් අද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක් විසින් ගෙන ආ බවත්, තම ඉල්ලීම වනුයේ දෙපැත්තෙන්ම සිදු කරන ලද මෙම ඉල්ලීම අනුව හපුගස්වත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 10.15 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමනි, මාස 06ක් ගතවූ පසු නැවත එම යෝජනාව සභාවට ඉදිරිපත් කළ හැකි බවත්, ඒක නීතියක් බවත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් යෝජනා ඉදිරිපත් කරන බවත්, මෙතෙක් යෝජනා ඉදිරිපත් කර ඇති ප්‍රමාණය වැඩි බැවින්, යෝජනා ඉදිරිපත් නොකරන්න යන මතයට පැමිණිය බවත්, ඒ අනුව සියලුම දෙනා ඒ සම්බන්ධව සමතයකට පත් වූ බවත්, මාස 06 ක් ගිය තැන ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම සෙමින් සෙමින් යෝජනා ගෙන එන බවත්, යෝජනා ගෙන ඒමට නොහැකි නම් දෙපැත්තෙන්ම අනවශ්‍ය බවත් ආණ්ඩු පක්ෂයේ යෝජනා විශාල ප්‍රමාණයක් පවතින බවත්, ඒවා පමණක් ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, තමන්ගේ ඒ සඳහා ප්‍රශ්නයක් නොමැති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙතෙක් ලබා දී ඇති සංවර්ධන යෝජනා දෙසිය ගාණනක් පවතින බවත්, මේ වර්ෂයට මීළඟ සභා වාරයේ සිට සංවර්ධන යෝජනා සිමා කරන ලෙසත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා

ගරු සභාපතිතුමනි, ගිය වර සභාවේ සභාපතිතුමා විසින් ප්‍රකාශ කර තිබෙන බව ප්‍රකාශ කරමින් 2026.005.12 වන සභා වාර්තාවේ කොටසක් මෙසේ උපුටා දක්වන ලදී.උපුටා ගැනිම,

“සභාපති හැටියට මම නියෝජනය කරන්නේ සියලුම පක්ෂ සහ සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීවරියන් බවත්, ඒ නිසා ඉදිරියේදී අපි යෝජනා දානව නම්, එහෙම කිහිප දෙනෙක්ගේ ඒවා නොදා ඉන්නත් බැරි බවත්, ඒ නිසා එහෙම යෝජනා දානව නම් හැමෝගෙම යෝජනා දාන්නත්, නැත්නම් හැමෝගෙම ඒවා නොදා ඉන්නත් තමන් පොරොන්දු වන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. නැත්නම් තාවකාලිකව නොදා ඉමු බවත්, ඒක පක්ෂද විපක්ෂද බලලා එහෙම අයවැයට යොමු කරලා තියෙන මුදලත් බලලා, කාලයේ අවශ්‍යතාවයත් බලලා වැඩ කරන්න ඕන බවත්, සභාපති හැටියට තමාගේ අවසාන තීරණය යෝජනා දාන්න පුළුවන් අය යෝජනා ඉදිරිපත් කරන ලෙසත්, එය තමාගේ පුද්ගලික තීරණය බවත්, අයවැයට වෙන් කර ඇති මුදල හා කාර්යක්ෂමතාවත් බලා සභාවේ තිරණය කොහොමද කියලා ප්‍රකාශ කරන ලෙසත් මෙහිදී ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.” උපුටා ගැනීම අවසන්.

මේ අනුව දෙපැත්තේ අය මේ සම්බන්ධව සලකා බැලිය යුතු බවත්, අයවැය ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතු බවත්, ඒ අනුව දෙපැත්තෙ ම අයගේ යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බව තමාගේ ගෞද්ගලික අදහස බවත්,

යනුවෙන් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් අසහස් ප්‍රකාශ කර ඇති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 10.18 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, යෝජනා ගෙන ඒම නතර කරමුය කියා ගරු සභාපතිතුමාගේ හා ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ඒකාබද්ධ කාරක සබා රැස්වීමේ දී එකඟතාවයකට පැමිණි බවත්, ප්‍රතිපාදන වෙන් කිරීමේදී ආණ්ඩු පක්ෂයට ලොකු ප්‍රමාණයකුත් විපක්ෂයට ලක්ෂ 24 ක මුදලකුත් වෙන් කරන බවට එහිදී එකඟතාවයකට පැමිණි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා පැවසුව පරිදි සැමට එක හා සමානව සලකන බව ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ද සඳහන් වන සඳහන් වන බවත්, ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබූ දේ දැන් ක්‍රියාත්මක කිරීමට හදනවා කියා ඉතා සතුටින් ජනතාව සමඟ තමන් පැවසූ බවත්, මුදල් කමිටු අවස්ථාවේ දී, ඉදිරියේදී මුදල් වෙන් කරන්නේ කෙලෙසද යන්න ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගෙන්, තමන් විමසා සිටි බවත්, උපසභාපතිතුමාගේ පිළිතුර වූයේ අපට මුදල් දෙන්නේ නැත කියා බවත්, වැඩිම යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කළ කණ්ඩායමේ එක් අයෙක් තමන් බවත්, තමන් සද්භාවයෙන් බලා සිටින්නේ මෙම මුදල් ලැබෙන තුරු බවත්, නිල වශයෙන් ප්‍රකාශ නොකළත් ලබාදුන් පිළිතුර සම්බන්ධයෙන් තමන් සතුටු වන බවත්, මේ මොහොතේ ඒ මුදල් වෙන් කිරීම සම්බන්ධව සියලුම විපක්ෂයේ මන්ත්‍රීවරු වෙනුවෙන් නිල ප්‍රකාශයක් මේ මොහොතේ බලාපොරොත්තු වන බවත්,මෙම මුදල් වෙන් කර දෙනවාද නැද්ද යන්න පිළිබඳවත් ඉදිරියේදී කටයුතු කළ යුත්තේ කෙසේද කියාත්, වැඩිදුරටත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා පෙ.ව 10.20 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, 2026.05.19 2027 වර්ෂයේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අයවැය සඳහා යෝජනා ලබා ගැනීම යටතේ ලිපියක් ලැබුනු බවත්, "2027 වර්ෂයේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අයවැය ලේකනය සකස් කිරීම සඳහා යෝජනා රැස් කිරීමේ කටයුතු මේවන විට ආරම්භකර ඇත.පහත සඳහන් ක්ෂෙත්‍රයන් යටතේ යෝජනා මෙම සභාව වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි." ඒ අනුව සෞඛ්‍ය, භෞතික සැලසුම්, මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි, ජල සේවා, වෙනත් පොදු උපයෝගිතා සේවා, සුභ සාධක සේවා කියන කාණ්ඩය යටතේ,භෞතික සැලසුම් මං මාවත් කියන කාණ්ඩය යටතේ බෝපැත්ත මනන්නගෙ හේන වත්තට යන පාරේ ඉහළ කොටස සංවර්ධනය කර දෙන ලෙස තමන් යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, ඒ යෝජනාව ප්‍රතික්ෂේප කළ බවට ලිපියක් ලද බවත්,

"ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය සභා රැස්වීම් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම - 2026 ජූනි මාසය. ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ 2026.06.09 වන දින පැවැත්වෙන සාමාන්‍ය සභා රැස්වීම් නියාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලද 2026.05.27 වන දිනැති ලිපිය හා යොමු වේ.

02.එම ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති සංවර්ධන යෝජනාව, 2026 වර්ෂය සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන ඉක්මවා ඇති බැවින් 2026.06.09 වන දින සභා රැස්වීම් න්‍යාය පත්‍රය සඳහා ඇතුළත් කළ නොහැකි බව කාරුණිකව දන්වමි."

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 10.23 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ඔබතුමන්ලා අයවැය යෝජනා ඉල්ලූ නිසා ඒ සංවර්ධන යෝජනාව ඉදිරිපත් කළ බවත්, අයවැය ප්‍රතිපාදන ඉක්මවා ඇති බැවින් අයවැය ප්‍රතිපාදනවලින් මුදල් වෙන් කරන්න හැකියාවක් නැති බව ඉන් පසු ප්‍රකාශ කර ඇති බවත්, ජූනි මාසය සඳහා යෝජනා ලබා ගැනීමේදී මෙම අයවැය ප්‍රතිපාදන වලින් සංවර්ධන කටයුතු කළ හැකිද මේ සඳහා කොපමණ

සංවර්ධන කටයුතු ප්‍රමාණයකට මෙම මුදල් ප්‍රමාණවත්ද යන්න පිළිබඳව යම්කිසි තක්සේරුවක් සිදු කර ගණනය කිරීමක් සිදු කර නොවෙයි ද මෙම අයවැය සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස කියා සිටින්නේ යන්න පිළිබඳව තමන් විමසා සිටින බවත්, යෝජනා ලබා දුන් පසු ප්‍රතික්ෂේප කරන්නේ ඇයි යන්නත්? යෝජනාව ලබාදුන් පසු ප්‍රතික්ෂේප නොකර කුමන හෝ ක්‍රමවේදයකට මෙම කටයුතු සිදු කිරීම සුදුසු බවත්, විපක්ෂයේ යෝජනා ඉවත් කර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා පමණක් න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බවත් එය ගැටළුවක් බවත් මේවා

නිරාකරණය කරගත යුතු බවත් සාධාරණ වැඩපිළිවෙලක් සඳහා යායුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදීත් මේ පිළිබඳව තමන් කතා කළ බවත්, ඒ පිළිබඳව ගියවර වාර්තාවේද සටහන් වී ඇති බවත්, නමුත් අද වන තුරුත් යෝජනා ප්‍රතික්ෂේප වීමට හේතුව සඳහන් කර ලිඛිතව දැනුම්දීමක් සිදුව නොමැති බවත්, ආණ්ඩු පක්ෂයේ යෝජනා පමණක් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන බවත්, විපක්ෂයේ යෝජනා ඉදිරිපත් නොකරන බවත් සඳහන් කරන ලදී.ඒ පිළිබඳව කණගාටු වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 10.25 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඔබතුමා මෙම න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යෝජනා ඉදිරිපත් කළා ද?

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

නෑ. මීට පෙර යොමු කළත් යෝජනා ආණ්ඩු පක්ෂයේ යෝජනා පමණක් ඇතුළත් වීම සම්බන්ධව තමා ප්‍රශ්න කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

දැනට සභා සම්මත වූ යෝජනා විශාල ප්‍රමාණයක් තිබෙන බවත්, එම යෝජනා ප්‍රමාණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බවත්, කොපමණ යෝජනා ඉදිරිපත් කළත් පෙළ ගස්වා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමට මුලිකත්වය දෙන බවත්, ඒ නිසා යෝජනා ඉදිරිපත් කළා කියා තේරුමක් නොමැති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභා රිතිවල සඳහන් 37 වගන්තිය ගැනද අවධානය යොමු කර කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේවන විට වැඩිම යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත්තේ තමන් විසින් බවත්, ගිය වර්ෂය සඳහා යෝජනා 28 තමන් විසින් ඉදිරිපත් කර ඇති බවත්, මෙවිවර යෝජනා ප්‍රමාණයක් කරන්න පුළුවන් ද බැරිද යන්න තමන්ටද සිතුන් නැති බවත්, මේ තත්ත්වය දැන ගත් පසු තමන් කිසිම යෝජනාවක් යොමු නොකළ බවත්, යෝජනා ඉදිරිපත් කර ඒවා වාර්තාවෙහිද සඳහන් වුවද එම යෝජනා ඉටුකිරීමට තරම් ප්‍රමාණවත් මුදලක් නොමැති බව පසුව තමන්ටද අවබෝධ වූ බැවින් ඉන් පසු තමන්ද යෝජනා ඉදිරිපත් නොකළ බවත්, සභාවේ සිටින සියලු දෙනා මෙසේ

යෝජනා ඉදිරිපත් කිරීමේ දී මේ යෝජනා දෙසිය තුන්සිය ගණන් එකතු වූ විට මෙවා සිදු කිරීමට මුදල් තිබේද යන්න ප්‍රශ්නයක් තිබෙන බවත්, ඒ ඉදිරිපත් කළ යෝජනා 28 න් යෝජනා දෙක තුනක් කර ගැනීමට හැකි වූ බවත්, මේ සැම මන්ත්‍රීවරයෙක් ම සභාවට පැමිණෙන්නේ යෝජනාවක් රැගෙන බවත්, ඡන්ද දායකයින්ගේ ප්‍රශ්නවලටද විසඳුම් ලැබිය යුතු බවත්, ඒ නිසා මේ සඳහා ක්‍රමවේදයක් සකසා ගත යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 10.28 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ගරු සභාපතිතුමනි, යෝජනා දෙසිය හැත්තෑ ගණනක් යෝජනා ලැබුණත්, ප්‍රාදේශය සභාව කාර්යක්ෂම නැති බවත්, කාර්යක්ෂමව ඉදිරියට යන්න නම් ඒ යෝජනා ක්‍රියාත්මක කළ පසු නැවත යෝජනා ඉදිරිපත් කළ යුතු බවට තමන්ට පැහැදිලි වූ කාරණාව බවත්, ඒ අනුව සභා වාර දෙකකදි තමන් කිසිදු යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටි බව ද, අපේ සබාව යම් තැනකට ලෙනියැමට අවශ්‍ය නම් ඒ සඳහා තමන්ටද දායකත්වයක් සපයන්න පුලුවන් නම් හොඳයි කියා බවත්, දැනට ඉදිරිපත් කර ඇති යෝජනා හරි ක්‍රියාත්මක කරයි කියන බලාපොරොත්තුවෙන් බවත්, ඒ දෙසිය හැත්තෑ ගණන ක්‍රියාත්මක කර නැවත සංවර්ධන යෝජනා දැමීම සුදුසු බවට තිරණය වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

විපක්ෂය සඳහා ලබාදෙන බව පැවසූ ලක්ෂ 24ක මුදල පිළිබඳව තමාට දැන ගැනීමට අවශ්‍ය බවත්, ඒ මුදල කෙසේද ලැබෙන්නේ යන්න පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 271 ක යෝජනා සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ලැබී තිබෙනවා නම්, සියලු දෙනා ම එක තිරණයකට පැමිණ ඒ අතරින් සුදුසුම යෝජනා පමණක් සාකච්ඡා කර තෝරා ගෙන අයවැය සැකසිම සිදු කළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

2027 අයවැය යෝජනාව සැකසීමේදී සැවොම සහභාගී වී සාකච්ඡා කර යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බවත්, දැනට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඉදිරිපත් කළ යෝජනා තිබෙන බවත්, මේවන විට යකුදාගොඩ වසමේ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමාගේ යෝජනාවක් ද මේවන විට ක්‍රියාත්මක වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාවකට මේ වන විට ඇස්තමේන්තු සාදා ඇති බවත්, ඒ නිසා නැවත යෝජනා ඉදිරිපත් කිරීමට පෙර මේ වන විට සම්මත වී ඇති යෝජනා අවසන් කිරීම සුදුසු බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 10.30 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා සඳහන් කළ පරිදි සාම්ප්‍රධායික ලෙස නිශ්චිත අරමුණක් නොමැතිව දිගින් දිගටම යෝජනා ඉදිරිපත් කළ නිසා මෙපමණ ප්‍රමාණයක් යෝජනා එක් රැස් වී ඇති බවත්, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ද නොමැති බැවින් තමන් යෝජනා 03ක් පමණක් ඉදිරිපත් කළ බවත්,සුළු මුදලක් හොලැබෙනවා නම්, අත්‍යවශ්‍ය කුඩා යෝජනා හෝ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසත්, තමන් විශාල යෝජනා ප්‍රමාණයක් යොමු කර නොමැති බවත්, අසාධාරණ ලෙස කොල පිරවීම සඳහා යෝජනා ඉදිරිපත් නොකළ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, විපක්ෂයට ලබා දීමට තිරණය කළ ලක්ෂ 24 දෙනවද නැද්ද කියා තමන් විමසා සිටින බවත්, සභාවට යෝජනා ඉදිරිපත් කර විහිළුවට ලක්විය නොහැකි බවත්, එම නිසා එම මුදල ලබා දෙනවාද නැද්ද යන්න ස්ථිර පිළිතුරක් බලාපොරොත්තු වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමන් හිඳුරංගල ප්‍රදේශයේ අවමංගල්‍ය කටයුත්තක් සඳහා සහභාගී වූ බවත්, ඒ අවස්ථාවේදී එහි සිටි ජනතාව විසින් බල්බ් සම්බන්ධයෙන් විමසීමක් සිදු කළ බවත්, සමහර බල්බ් සති දෙකෙන් අක්‍රිය වූ බව එම ජනතාව විසින් පැවසූ බවත්, තමන් විසින් බල්බ් නොදැමූ බවත්, පක්ෂයේ මන්ත්‍රිතුමා විසින් ඒ බල්බ් දැමූ බවත්, ඒ සම්බන්ධව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා සමඟ සාකච්ඡා කර ගත යුතු බවට ජනතාවට දැනුම් දුන් බවත්, වොරන්ටි කාර්ඩ් එක බැලූ විට එම බල්බ් රුපියල් 150.00 බල්බ් දමා ඇති බව දැන ගන්නට හැකි වූ බවත්, තමන් විසින් පෞද්ගලික වියදමින් දැමූ බල්බ් 24 මෙවන විටත් ක්‍රියාත්මක තත්වයේ පවතින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම ලක්ෂ 24 සභාවේ සම්මත වූ එකක් නොවන බවත්, එම මුදල බෙදා ගන්නා ආකාරය පිළිබඳව විස්තරයක් එදින ලබා නොදුන් බවත්, ඒ පිලිඳව සාකච්ඡා නොකළ බවත්, එම ලක්ෂ 24ක මුදල පක්ෂ විපක්ෂවද නොමැතිනම් තනි පුද්ගලද කියා තීරණයක් නොගත් බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ලක්ෂ 24 ක මුදල ලබා දීම ඒකාබද්ධ කාරක සභාවක් පවත්වා තීරණය කළ බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම මුදල ලබාදීමට නියාමනය කුමක්ද කියා ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් විමසා සිටින ලදී. (සෝෂාව) තම තමන් ඉදිරිපත් කළ යෝජනා නිශ්ප්‍රභා කර මුදල් ලබා ගන්නවාද නැද්ද යන්න තීරණයකට නොපැමිණි බව එතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, නැවත ඒකාබද්ධ කාරක සභාවක් පැවැත්විය යුතු බවත්, මේවා පත්තර වලද සටහන් විය යුතු කාරණා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ කණ්ඩායම තීරණය කර තිබුණේ එම මුදල් ප්‍රමාණය එක් එක් මන්ත්‍රීවරයා අතරේ බෙදා ගැනීමට බවත්, ඒ සම්බන්ධව ආණ්ඩු පක්ෂයේ අය ගැටලුවක් කර ගත යුතු නොවන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, සභාවේ මන්ත්‍රිවරයෙක් වුණත් මේ වන තෙක් කිසිදු වීථි පහනක්වත් නොලැබුණු බවත්, එදින ඒකාබද්ධ කාරක සභාවට පැමිණීමට නොහැකි වුවත් ලක්ෂ 24 ක් විපක්ෂයට ලැබෙන බව පැවසීම පිළිබඳව තමන්ද

සතුටු වූ බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගෙන් එම තීරණය ඉක්මනින් ක්‍රියාත්මක කරන ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම ලක්ෂ 1 1/2 ක මුදලින් වැඩක් කර ගැනීමට නොහැකි බවත් එම නිසා හියුම් පයිප්පයක් හෝ ලබාදීමට තමන් තීරණය කර තිබූ බවත්, ලේකම්තුමා සඳහන් කළ පරිදි පරිච්චින්න කර එම මුදල ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කළ හැකි නම් එම මුදල් ලබාදෙන මෙන් තමන් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාගෙන් ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඉදිරියේදී මෙතෙක් සභාවට යොමු කර සම්මත වී ඇති දෙපැත්තේම යෝජනා එකින් එක ක්‍රියාත්මක කරන බවත්, හියුම්පයිප්ප ලබා දීමේ යෝජනා, අලුතින් එස්කැවේටර් යන්ත්‍රයක් මිලදී ගන්නා බැවින් පස් කපන ඒවා වැනි යෝජනා ඉදිරිපත් කිරීම වරදක් නොවන බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

03 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

වලවිට හා නැ/ කලටුවාව වසම්වලට අයත් ප්‍රාදේශිය සභා මාර්ගවල කාණු පද්ධතිය පිළිසකර කිරීම සඳහා බැකෝ යන්ත්‍රයක් යෙදවීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.39 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, කාණු පද්ධතිය නිසි ලෙස නොමැතිකම නිසා ජනතාවට ගමන් කළ නොහැකි ලෙස මාර්ග සියල්ල කැඩී යන බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, ආපදා තත්වය පිළිබඳවද සලකා බලා ඉදිරියේදී මෙම කාණු පද්ධතිය සකසා ගැනීමට බැකෝ යන්ත්‍රයක් ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව ඉටුකිරීම සඳහා සභාව සතුව මුදල් නොමැතිනම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යොමු කර එම කාර්යය සිදු කළ හැකි ක්‍රමවේදයක් තිබෙන බව ගරු ප්‍රාදේශය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමා නිල වශයෙන් මැදිහත් වී සම්බන්ධීකරණයක් සිදුකර එම කාර්යය සිදුකළ හැකි බවත්, ඉදිරියේදී බැකෝ යන්ත්‍රයක් ලබා ගන්නා බවත්, එම නිසා පස් කපන කාණු කපන වැනි යෝජනා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් මීට සුළු මොහොතකට පෙර ප්‍රකාශ කළ බවත්, ඒ සඳහා දැන් ම සිට යෝජනා ඉදිරිපත් කරන ආකාරයක් දැකිය හැකි බවත්, තමන් සද්භාවයෙන් පවසා සිටින්නේ එම ප්‍රදේශය නිරන්තරයෙන් ආපදාවට ලක්වන ප්‍රදේශයක් බැවින් සංවර්ධනය කළ යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.40 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 10.40 ට සභා ගර්භයෙන් පිට විය.

03 (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා**.**

වලවිට සීතාවක සෙවන ප්‍රාදේශිය සභාවට වෙන් වූ ඉඩම් කොටස සේවා පියසක් සඳහා වෙන් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා**.**

ගරු සභාපතිතුමනි, වලවිට සීතාවක සෙවන පර්වස් 40 ක පමණ වූ ඉඩම් කොටස **සේවා** පියසක් ඉදිකිරීම සඳහා වෙන් කිරීමට අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

04 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා.

මීගස්වල පීරිස් මාවතේ රංජිත් මහතාගේ නිවස අසල සිට දැරනියගල මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයෙහි නිම නොකළ කොන්ක්‍රීට් කිරීමට ඉතිරිව ඇති කොටස සංවර්ධනය කිරීම සඳහා යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 10.41 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මීගස්වල පීරිස් මාවත මේවන විට කොන්ක්‍රීට් කර අවසන් වුවද අඩි 20 ක පමණ ප්‍රමාණයක් නිම කිරීමට ඉතිරිව ඇති බවත්, එම ඉතිරිව ඇති කොටස මඩ සහිත බවත්, එම කොටස කොන්ක්‍රීට් කළ විට එම මාර්ගය

සම්පූර්ණයෙන්ම සංවර්ධනය කර අවසන් වන බවත්, ලක්ෂ 02 ක් පමණ මුදලක් වැය වනු ඇතැයි තමන් විශ්වාස කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.

හල්ගහවලමුල්ල ගම්මානයට යන මාර්ගයේ බෝක්කුව ළඟ නදීක මහතාගේ නිවස අසල සිට පත්මසිරි මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් දැමීම හා පාරේ කැඩී ගිය කොටස සඳහා පැති බැම්ම සකසා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.

ගරු සභාපතිතුමනි, මෙය හදිසි ආපදා තත්වයක් නිසා ඇති වූ යෝජනාවක් බවත්, මෙය වරිපනම් සීමාවේ පවතින බවත්, ඇල අයිනෙන් යන මාර්ගයක් බවත්, ඇළ දෙසට එම මාර්ගයෙන් භාගයක් පමණ කඩාගෙන ගොස් ඇති බවත්, එම ස්ථානයෙන් ඉහළ පවතින නිවෙස් සඳහා ත්‍රි රෝද රථයක්වත් ගමන් කිරීමට නොහැකි බවත්, ඔවුන්ගේ වාහන පහළ නවතා යන බවත්, වරිපනම් බදු ගෙවන ජනතාව ලෙස එම ජනතාව විසින් විමසා සිටින්නේ වරිපනම් ගෙවීම සිදු කරන නිසා එම පහසුකම් සපයා දෙන ලෙස ඉල්ලීම් කරන බවත්, ඒ අනුව මේ සඳහා ප්‍රමුඛත්වයක් ලබාදෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය විසින්ඉල්ලා සිටින ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

06 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

මිටිපොල මොරගහ කන්ද පාරට දිග අඩි 6 ක් හා පළල අඩි 1 ක් පමණ වන හියුම් පයිප්ප 4 ක් ලබා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

ගරු සභාපතිතුමනි, මිටිපොල පාලම්වත්ත හරහා යන ගමට යන මාර්ගය සංවර්ධනය නොවූ මාර්ගයක් බවත්, ප්‍රදේශවාසීන් විසින් තම පෞද්ගලික ශ්‍රමය යොදා පාර කපා ඇති බවත්, ඒ සඳහා හියුම් පයිප්ප යොදා සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

06 (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

අක්කර 26 බෝධිය අසලින් ගම්මානයට පිවිසෙන තුන් මායිම මාර්ගය දක්වා මාර්ගය කපා සකස් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

ගරු සභාපතිතුමනි, අක්කර 26 බෝධිය අසලින් ගම්මානයට පිවිසෙන තුන් මායිම මාර්ගය දක්වා මාර්ගය සංවර්ධනය නොවූ පැත්තක් බවත්, ත්‍රී රෝද රථයකින් හෝ ගමන් කිරීමට නොහැකි බැවින් එම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම මාර්ගය සඳහා ප්‍රතිපාදන තිබේ නම් වෙන්ක ර දිය යුතු මාර්ගයක් බවත්, හදිසි රෝගියෙක් පවා ගෙන යාමට නොහැකි වගුරු බිමක් බවට ඇතැම් ස්ථාන පත්ව ඇති බවත්, ඒ සඳහා ප්‍රමුඛත්වක් ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (i) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාලයාධිපති තනතුරු 03 ක් අනුමතව තිබුණ ද තත්‍ය කාර්ය මාණ්ඩලය තුළ සිටින්නේ එක් පුස්තකාලයාධිපතිවරියෙක් පමණි.ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති ස්ථානමාරු වීම හේතුවෙන් දම්මුල්ල පුස්තකාලයේ පුස්තකාලයාධිපති ඇහැලියගොඩ පුස්තකාලයට අනියුක්ත කළ බැවින් දම්මුල්ල පුස්තකාලයේ දින 02 ක් පුස්තකාලයාධිපති සේවයේ යොදවා ඇති අතර ඉතිරි දින 05 පුස්තකාල සහයිකාව සේවය කරයි.නිරන්තරයෙන් එක් අයෙක් පමණක් සේවයේ යෙදීමේ දී ගැටලු ඇති වන බැවින් සේවා අවශ්‍යතාවය මත තත්කාර්ය පදනමින් පුස්තකාල සහයක තනතුර සඳහා සුදුසු අයෙකු සේවයේ යොදවා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙම යෝජනාව පුස්තකාල කමිටුව මගින් ඉදිරිපත් කළ බවත්, දම්මුල්ල පුස්තකාලයේ එක් අයෙක් පමණක් සිටින බවත්, සභාවේ යෝජනා සම්මත කළද අනුමැතිය සඳහා පළාත් සභාව වෙත යොමු කළ යුතු බවත් වැඩිදුරටත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, **මෙය කාගේ යෝජනාවක්ද? එම කමිටුව නියෝජනය කරන්නේ කවුරුන් දැයි** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා **විසින් විමසන ලදී.**

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පුස්තකාල කමිටුව නියෝජනය කරනු ලබන්නේ විෂය නිලධාරිනිය වන ආර්.එච්.ජී.සාරංගා මිය, පුස්තකාල හතරේ සියලු නිලධාරීන් සිටින අභ්‍යන්තර කමිටුවක් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (ii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/ LG/ 3/ 6/ 4 හා 2026.01.21 දිනැති ලිපියට අදාළව තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට ලැබී ඇති අනුමැතිය පරිදි තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගෙන ඇති එස්. කුමාර මයා සමඟ 2026.07.01 දින සිට 2026.09.30 දක්වා මාස 03 ක කාලයක් වෙනුවෙන් සේවයේ යොදවා ගැනීමටත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10 / 2025 හි අනු අංක 16 පරිදි වේතන ගෙවීමටත් සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

07 (iii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන පහත නම් සඳහන් සේවක මහත්ම මහත්මීන්ගේ 2026 ජූලි මස 01 වන දින සිට දෙසැම්බර් දක්වා මාස 06 ක කාලයක් සඳහා නව ගිවිසුම් ඇති කර ගැනීමටත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10 / 2025 හි අනු අංක 16 පරිදි වේතන ගෙවීමටත් සුදුසු බව යෝජනා කරමි.

<u>නම</u>	<u>තනතුර</u>
01. එච්. චන්ද්‍රාවතී මිය	සෞඛ්‍ය කම්කරු
02. කේ.බී. සන්ධ්‍යා කුමාරි මිය	සෞඛ්‍ය කම්කරු
03. ජේ. ක්‍රිෂාන්ති කුමාරි මිය	සෞඛ්‍ය කම්කරු
04. පී. කුමාර මයා	සෞඛ්‍ය කම්කරු
05. එච්.ඒ. විජයලතා මිය	සෞඛ්‍ය කම්කරු
06. එම්.පී. ජීවරාණි මිය	සෞඛ්‍ය කම්කරු
07. ඩබ්.එච්.ඩී. සරත් ගාමිණී රණසිංහ මයා	සෞඛ්‍ය කම්කරු
08. එස්.ඊ. රාණි	සෞඛ්‍ය කම්කරු
09. ජේ.එම්.ආනන්ද මයා	සෞඛ්‍ය කම්කරු
10. කේ.දිසාන් මයා	සෞඛ්‍ය කම්කරු
11. ඕ.ඩී.සමරසිංහ මයා	සෞඛ්‍ය කම්කරු
12. පී.කේ විජය කුමාර් මයා	සෞඛ්‍ය කම්කරු
13. ඩබ්.ඒ.ජනක ප්‍රියංකර මයා	සෞඛ්‍ය කම්කරු
14. එල්.ඒ.පුෂ්පකුමාර මයා	සෞඛ්‍ය කම්කරු
15. සී.සිවචන්ද්‍රන් මයා	සෞඛ්‍ය කම්කරු
16. සරත් නන්දසිරි මයා	රියදුරු
17. කේ.කුමාරවේල් මයා	රියදුරු
18. ජී.ආර්. සමීර මධුෂාන් ගමලත් මයා	රියදුරු
19. ඩී. එම්.සුනිල් මයා	මුරකරු
20. ඩබ්. විජේරත්න මයා	මුරකරු
21. කේ.ඒ.ඩී. වසන්ත මයා	මුරකරු

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (iv) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ සභාව විසින් සම්මත කර ඇති පුස්තකාල අතුරු ව්‍යවස්ථාවේ අංක 05 වගන්තිය ප්‍රකාරව මහජන පුස්තකාල අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය සඳහා පුස්තකාල උපදේශන කාරක සභාවක් පත් කර ගත යුතුව ඇත.ඒ සඳහා පහත නම් සඳහන් සාමාජිකයන් උපදේශන කාරක සභාව සඳහා පත් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

<u>පුස්තකාල උපදේශක කාරක සභාව සඳහා යෝජිත සාමාජික නාම ලේඛනය.</u>

- ✓ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
- ✓ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.
- ✓ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා.
- ✓ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිනිය.
- ✓ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා.
- ✓ ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලයේ පාඨශාලාචාර්ය කළ්‍යාණ ධම්ම ස්වාමීන් වහන්සේ.
- ✓ අල් අක්ෂා ප්‍රාථමික විද්‍යාලයේ පාඨශාලාචාර්ය ඒ කරුණානිදි මහතා.
- ✓ ප්‍රවීන ඉතිහාසය දේශක ඒ.ජී.රුවන් ජයසේකර මහතා.
- ✓ අල් හික්මා ප්‍රාථමික විද්‍යාලයේ පාඨශාලාචාර්ය අහමඩ් හිල්මාන් හිල්මාන් මහතා.
- ✓ සබරගමු පළාත් පුස්තකාලසේවා මණ්ඩලයේ සාහිත්‍ය අනු කමිටු සාමාජික එම්.එස්.යු.කේ.වැලිගෙපොල මහතා.
- ✓ ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති කේ.ඩී.රත්නසිරි මහතා.
- ✓ ප්‍රාදේශීය සභා ලේකම් ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා.
- ✓ ප්‍රජා සංවර්ධන නිලධාරී ජී නිලූෂි සෝමරත්න මිය.
- ✓ පුස්තකාලයාධිපති ඩී.පී.පී.එන්.පෙරේරා මිය.
- ✓ ප්‍රජා මණ්ඩලය නියෝජනය කිරීමට ඩබ්ලිව්.එල්.ඒ.එස්.කේ.වීරසූරිය මයා.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙහි එක් නමක් අඩු බවත්, ඒ නම ඔබතුමාලට මගහැරී ඇති බවත්, ඒ නම අසංක රාජකාරුණා මයාගේ නම බවත්, ඇහැලියගොඩ මැතිවරණ කොට්ඨාශයේ ම ජාතික ජන බලවේගය නියෝජනය කරන අධ්‍යාත්මික නොවන සියලු නායකයින්ගේ නම් මෙහි ඇතුළත් කර ඇති බවත්, පුස්තකාල උපදේශන සභාව සඳහා දේශපාලනය ගෙන එන්නේ ඇයිද? යන්නත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසා සිටින ලදී. පුස්තකාල උපදේශන සභාවටත්, ග්‍රාම සංවර්ධන සමිතිය, මහිලා සමිතය, මරණාධාර සමිතිය, තරුණ බෞද්ධ සමිතිය යන සියලු ම දේ සඳහා මාලිමාවේ නියෝජිතයින් ඇතුළත්ව ඇති බවත්, මෙය ස්වාධීනව කටයුතු කළ යුතු බවත්, ලේකම්තුමා හා නිලධාරීන් ගැන තමාට කිසිවක් කිව නොහැකි බවත්, අනික් පිරිස සම්බන්ධව දේශපාලන මතය, දේශපාලන භාවිතය පිළිබඳ තමාට හොඳ අවබෝධයක් තියෙන බවත්, ඒ නිසා අසංක රාජකාරුණා මයාගේ නම මේ සඳහා ඇතුළත් විය යුතු බවත්, මෙය මාලිමා කරණය නොකළ යුතු බවත්, පුස්තකාලය හොඳ තත්ත්වයක තිබිය යුතු බව සභාවේ සියලු මන්ත්‍රිවරු විශ්වාස කරන බවත්, තමන් කියන සෑම වචනයක් ම වාර්තාවේ ලියවිය යුතු බවත්, තමන් එය වගකීමෙන් ප්‍රකාශ කරන බවත්, මේ පුස්තකාල උපදේශන සභාව දේශපාලනීකරණය නොකරන ලෙසට ගෞරවනිය ලෙස ඉල්ලා සිටින බවත්, මෙම නාම ලේඛනය සැදුවේ කුමන අරමුණකින්ද කියා තමන් නොදන්නා බවත්, මේක දේශපාලනීකරණය කළා කියා මෙයින් පාඨකයින්ට ලැබෙන වාසිය, ලැබෙන ප්‍රතිලාභය, කුමක්ද යන්න තමන් නොදන්නා බවත්, මාලිමාව සඳහා උදව් කරන ,මාලිමාව සඳහා උපදෙස් ලබාදෙන ස්වාමීන් වහන්සේලා ඇතුලු සියලු දෙනා පමණක් ඇතුළත් කර සෑදු මෙම ලේඛනය කුමක්ද? කියා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසා සිටින ලදී.

විපක්ෂයේ කණ්ඩායම මෙම නාමලේඛනය සඳහා එකඟ බව ඔබතුමන්ලා විසින් විශ්වාස කරනවා නම් එය බොරුවක් බවත්, එය කිසිවෙක් විශ්වාස නොකරන බවත්, තමන් මෙම නාම ලේඛනය සඳහා විරුද්ධ බවත්, පුස්තකාලය ගොඩගැනීම සඳහා මෙම උපදේශන කාරක සභාව පිහිටුවනු ලබන බවත්, මෙය දේශපාලනීකරණය හා මාලිමාකරණය නොකරන ලෙසත්, වැදගත් දේශපාලන සංස්කෘතියක යන මේ අවස්ථාවේ මෙ දේශපාලනීකරණය නොකර ක්‍රියාත්මක වුවා නම් කැමති වන බවත්, උගත් බුද්ධිමත් පිරිස මාලිපාවේ පමනක් සිටින බවට විශ්වාස නොකරන ලෙසත්, එකින් එක මෙම සියලුම දෙනාගේ තොරතුරු පැවසිය හැකි බවටත්, පුස්තකාලය ගොඩනැගීම සඳහා හොඳ පිරිසක් එකතු

කරගෙන හොඳ වැඩපිළිවෙලක් සකසමු කියාත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 10.40 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, විඥ්ඥානය පිළිබඳව කතා කරපු නිසාම තමන් නැගී සිටිය බවටත්, මෙම කණ්ඩායම බොහොම වැදගත් බවත්, අවශ්‍ය නම් මේ අයගේ උප්පැන්න සහතිකයේ සිට තමන්ට ලබාදිය හැකි බවටත්, ගරු උප සභාපතිතුමන් විසින් විඥ්ඥානය පිළිබඳව පැවසූ නිසාම ගරු සභාපතිතුමන් ඉතාමත් ගෞරවයෙන් යුක්තව මෙම කාර්යය සිදුකරන බව හොඳින් දන්නා බවත්, මෙම ඇහැලියගොඩ හසුරුවන අධ්‍යාත්මික නායකයෙක් මෙහි සිටින බවටත්, එතුමාගේ උපදෙස් ලබාගතහොත් ඇහැලියගොඩ සභාව කඩා වැටෙන බවටත්, උප සභාපතිතුමන් විඥ්ඥානය පිළිබඳව කතා කළ බැවින් තමන් කියා සිටින්නේ දිලීන් මන්ත්‍රීතුමා හෝ මේ සඳහා පත් කළ යුතුව තිබූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ද පාඨශාලාචාර්ය වරයෙක් බවත්, එසේ වුණා කියා කිසිවෙක් ගැටලු නොකරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පුස්තකාලය සෑදීමට පළමු වර තීරණය කළ බවත්, දෙවනි වරට කොන්ක්‍රීට් යෙදීමට තීරණය කළ බවටත් ඉන්පසු ටයිල් ඇල්ලීමටත් පසුව සිවිලිම ගැසීමටත් වැනි වරින් වර මෙම වැඩ කටයුතු සිදුකිරීම ගැටළුවක් බවත්, සිවිලිමක් නොමැති වුවහොත් පොත් පිනිබෑමට ලක්වන බව දන්නා බැවින් නිවැරදි සැලැස්මක් තිබිය යුතු බවත්, වැසිකිළියට සිදුවූ දෙය මගින් එය පෙනී යන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අද දින සිට තමන් විපක්ෂයේ බවත්, ලේකම්තුමා විසින් අසුන් පැනවීම නීත්‍යානුකූල බවටත්, කුමන ස්ථානයේ සිටියද විපක්ෂයේ කාර්යභාරය සිදු කළ යුතු බවත්, මෙලෙස මේවා විනාශ නොකරන ලෙසටත් අද වන විට රෝහලේ කළමනාකාරිනියක් නොමැති තත්ත්වයකට පත්ව ඇති බවත්,රොහල් කම්ටුවද විනාශ වී ඇති බවත්, ඩෙංගු රෝගියෙකු මීට දවස් තුනකට පමණ පෙර රෝහල් ගත වූ බවත්, ඒ අවශ්‍ය වෙලාවට වෛද්‍යවරයෙක් එහි නැති බවත්, රත්නපුර යැවීම සඳහා යොමු කළත්, පසුව නැවත 6 වාට්ටුවට යොමුකර ඇති බවත්, මෙවැනි දේවල් සිදු නොකළ යුතු බවත්, ඔබතුමාලට කැමති අය ඒ සඳහා යොමු කරන අතර ම කවුරුන් හෝ විපක්ෂයෙක් අයෙක් මේ සඳහා පත්කරන ලෙසත්, විපක්ෂයේ සිටින්නේ ලෙඩ දාන මිනිස්සු නොවන බවත්, මෙවැනි වැඩ ඉදිරියට කරන්න එපා කියා ඉල්ලා සිටින බවත්, මෙය සංශෝධනය කිරීමට හැකි නම් වෙන කිසිවෙක් ඇතුළත් කරන්න එපා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කළ නම මේ සඳහා ඇතුළත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 10.57 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සඳහා නිර්දේශ ඇති බවත්, ජාති 03 කින් පුද්ගලයින් පත් කරන ලෙසට නිර්දේශ පැමිණි බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 10.59 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, නිර්දේශ පැමිණියේ කොහෙන්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ සභාව මගින් සම්මත කර ඇති පුස්තකාල අතුරු ව්‍යවස්ථාවේ අංක 05 වගන්තිය ප්‍රකාරව මහජන පුස්තකාල අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය සඳහා පුස්තකාල උපදේශන කාරක සභාවක් පත්කර ගත යුතුව ඇති බවත්, එය අතුරු ව්‍යවස්ථාවත් සමඟ ඇති බවත්, එහි ආගම් 03 ක් ඇතුළත් කළ යුතු බවට සඳහන්ව ඇති බවත්, ඒ අනුව ස්වාමීන් වහන්සේ නමක් හා අල් අක්ෂා ප්‍රාථමික විද්‍යාලයේ පාඨශාලාවාර්ය කෙනෙක් ඇතුළත් වී ඇති බවත්, ඔහු දෙමළ ජනතාව නියෝජනය කරන බවත්, මුස්ලිම් නියෝජනයක් ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා සහ එහි ඉල්ලා ඇති ලෙස අනෙක් අය නම් කර ඇති බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, සංශෝධනය කර අලුතින් නම් ඇතුළත් කළ හැකි නම් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කළ සඳරුවන් රාජකරුණා යන නම ද ඇතුළත් කරන ලෙසට එතුමන් විසින් ඉල්ලා සිටි අතර, එවිට පැලවත්තේ (සෝෂාව) එමෙන්ම පුස්තකාලය යනු අඩු පහසුකම් තිබුණත් අවිධිමත් පාඨක සමාජයක් තිබුණත්,හොඳ නියෝජනයක් තිබූ ස්ථානයක් බවත්, තමන්ද එය නියෝජනය කළ පුද්ගලයෙක් ලෙස හොඳ නියෝජනයක් තිබූ තැනක් බව ප්‍රකාශ කරන බවත්, එහි මාධ්‍යෝවිදීන්, සියලුම ආගමික නායකයින් ද සිටි බවත්, සියලු ම ජාතින් නියෝජනය කළ ආයතනයක් බවත්, අඩු පහසුකම් තිබුණ ද යම් ගුණාත්මක සංවර්ධනයක් තිබූ බවත්, පුස්තකාලයේ දියුණුවට යම් පිටුවහලක් සිදුවූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 11.01 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙම පත්කර ඇති අයගේ යම් බුද්ධි මට්ටමක හෝ නැතිනම් කල්ක්‍රියාවේ නොගැළපීමක් ඇත්දැයි ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමන් විසින් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, බුද්ධි මට්ටම හොඳ නිසා රාජකරුණා නම ද ඇතුළත් කරන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මන්ත්‍රිතුමා, වෙනසක් සිදු කිරීම සඳහා මෙය ලබාදී ඇති බවත්, ඒ නිසා මෙතුවක් කාලයක් සිදු කල ආකාරය පිළිබඳව හොඳින් දන්නා බවත්, අවුරුදු ගාණක් පැවති වහලය පිළිබඳව බලන ලෙසත් මේවන විට ඒවා සෑදී ඇති බවත් ඉතිරි පුස්තකාල හතර සඳහා ද වැඩි මුදලක් යොදවා ඇති බවත් පාඨක සමාජය, සිනමා සමාජය වැනි දේ ඇති කර වැඩ කටයුතු සිදු කර ගෙන යන බවද වැඩිදුරටත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තිබෙන නිර්ණායකද සමඟ සුදුසු අය මේ සඳහා යොදවා ගෙන ඇති බවත්, මෙය නැත් නම් එළ හරකයි මී හරකයි වගේ එකෙක් ගොඩට අදියි, එකෙක් මඩට අදී, එහෙම වැඩ කරන්න බැරි බවත්, දෙපැත්තට අදින නිසා පැහැදිලි ජන වරමක් ලබාදී ඇති බැවින් එයිනුත් එක් කොටියාශයක් ඇරෙන්න ඉතිරි සියලු කොටියාශ ජයග්‍රහණය ලබාදී ඇති බවත් එම

නිසා මේ අවස්ථාවේ තමන්ට එය සිදු කිරීමට ලබා දෙන ලෙසත් කකුලෙන් නොඅදින ලෙසත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. විහිළුක් කර තේරුමක් නොමැති බවද, බෙදීමක් අවශ්‍යශ නම් පවසන ලෙසද ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, බෙදීමක් අනවශ්‍ය බවත් සඳරුවන් රාජකරුණා යන නමද ඇතුළත් කරන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එම නම ඇතුළත් කරන එක අපේ වැඩක් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමා විසින් ප්‍රාජාතන්ත්‍රවාදය අර්ථ දක්වනු ලබන්නේ පෙර කී වචන වලින්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසා සිටින ලදී. සභාපතිතුමාගේ වචන වාර්තාවේ තිබුණොත් ගැටළුවක් වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.(සෝෂාව)

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඔබතුමා සභාවේ නැගි සිටින ප්‍රමාණයත් වැඩි බවත්, තමන් ප්‍රකාශ කරන වචන වාර්තාවේ සටහන් කරන ලෙසත් ඔබතුමා මෙන්ම තමන්ද පවසා සිටින්නේ තමන් විසින් පවසන සෑම වචනයක්ම වාර්තාවෙහි සඳහන් කරන ලෙස බවත්, ඒ සෑම වචනයක් සඳහාම වගකීම තමන් භාර ගන්නා බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.
ගරු සභාපතිතුමා ප්‍රජාතන්ත්‍රවාදය අර්ථ දක්වපු විදිය වැරදි බවත්, (සෝෂාව) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, කතෝලික ජනතාව නියෝජනය වෙනුවෙන් කවුරුන් හෝ පත්කර ඇත්දැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
එසේ ඇතුළත්ව නොමැති බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (v) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිකුමා.

2024.06.01 දින ඇති වූ අයහපත් කාලගුණය හේතුවෙන් දම්මුල්ල නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානයේ එදිනට පැවති ඖෂධ තොගය හානියට පත් වී ඇත.එම ඖෂධ තොගය හදුනා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන

ලද අතර එම කමිටුව 2026.05.26 දින රැස් වී ලබා දුන් වාර්තාව අනුව එම ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම නිර්දේශ කර ඇත.එබැවින් 2024 06. 01 දින දම්මුල්ල ආයුර්වේදයේ තිබී හානියට පත් වූ ඇමුණුම් viii හි සඳහන් ඖෂධ තොගය විනාශ කිරීම හා ඒවා අදාළ ලේඛනවලින් ඉවත් කිරීමට සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (vi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

උක්ත සඳහන් යෝජනාව ප්‍රකාරව දම්මුල්ල නිදහස් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ හානි වූ ඖෂධ විනාශ කිරීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත අපහරණ කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජේසිංහ මැතිතුමා.
- සංවර්ධන නිලධාරී ඩබ්ලිව්. පී. චමිල් ප්‍රියශාන්ත මයා.
- සංවර්ධන නිලධාරී එම්.එම්.ඩී.පී.ජයලත් මිය.
- සංවර්ධන නිලධාරී ආර්.එච්.ජී.සාරංගා මිය.
- සංවර්ධන නිලධාරී අනුෂා හෙට්ටිආරච්චි මිය.
- සංවර්ධන නිලධාරී ඩබ්ලිව්. කේ. ලලිතා කුමාරි මිය.
- ආදායම් පරීක්ෂක ඩබ්ලිව්.එන්.ආර්.වන්ද්‍රෙස්න මිය.
- කාර්මික නිලධාරී ටී.වී.නිශාන්ත රාමනායක මයා.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (vii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

2009 වර්ෂයට පෙර කාලයක සිට නැවත ලබා ගත නොහැනි වූ ඇහැලියගොඩ හා ගැටහැත්ත මහජන පුස්තකාලවලට අයත් පොත් 84 ක අලාභය අයකර ගැනීම සඳහා පාඨකයින්ට එරෙහිව සමථ මණ්ඩලයට පැමිණිල්ලක් යොමු කරන ලදී.එම පොත් ලේඛනය උපලේඛන 1 මඟින් ඉදිරිපත් කරන අතර, එම පොත් සඳහා නැවත අය කිරීමක් සිදු කිරීමට හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට සමථ මණ්ඩලයට ඉදිරිපත් කළ පැමිණිල්ල මඟින් නොහැකි වූ බැවින් රු.8,641.00 ක් වටිනාකමින් යුත් පොත් 84 අදාළ ලේඛනවලින් කපා ඉවත් කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි. (ඇමුණුම ix)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය පෙ.ව 11.07 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (viii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ නගරයේ අවිධිමත් ලෙස පදික මාර්ග අවහිර කරමින් පවත්වාගෙන යනු ලබන ජංගම මත්ස්‍ය වෙළෙඳ ව්‍යාපාර සඳහා ක්‍රමවත් වෙළෙඳසැල් 05 ක් පොළ භූමිය තුළ ඉදිකර වාර්ෂික බදු පදනම මත ලබා දීමටත් සඳහාත්

මෙම ප්‍රාදේශිය සභාව සතු , හරක් මස් වෙළෙඳසැළ සහ එළු සහ කුකුල් මස් වෙළෙඳසැල් යන වෙළෙඳසැල් 02 ද සතිපොළ භූමියේ ඉදි කිරීමටත් සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා පෙ.ව 11.08 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

නගරයේ පවතින ජංගම වෙළඳසැල් කිහිපය පරිසරයට ද උචිත නොවන බැවින් නගර සැලසුම සඳහාත් එය නොගැළපෙන බැවින් හා පාරිභෝගිකයන්ද එයින් පීඩාවට පත්වන බැවින් සභාව සතු පොළ භූමියේ වෙළඳසැල් 05ක් වෙන වෙනම ඉදිකරන බවත්, දැනට මතස්‍ය වෙළඳාම සඳහා පොළ භූමියේ ඉදි කර ඇති ස්ථානය මත්ස්‍ය වෙලදාමක් සිදු කිරීමට සුදුසු තත්ත්වයේ නොපවතින බවත්,ශීතකරන පහසුකම් හා ආලෝකය ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් නොමැති බවත්, එය අවිධිමත් ඉදි කිරීමක් බවත්, ඒ නිසා අවශ්‍ය පහසුකම් සහිතව වෙළඳසැල් කුටි 5 ක් සාදන බවත්, පොළට හැරෙන ස්ථානයේ ඇති එළු මස් සහ ගව මස් වෙළඳසැල වෙනත් කාර්යයක් සඳහා යොදවා ආදායම් උත්පාදනය

කර ගත හැකි බවත්, ඒම එළු මස් හා ගව මස් වෙළඳ සැළඳ පොළ භූමියේ ස්ථානගත කිරීමට බලාපොරොත්තු වන බවත්, ඒ අනුව වෙන් වෙන්ව වෙළඳසැල් 07ක් ඉදිකිරීමට යෝජනා කරන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක් බවත්, මෙම යෝජනාව යොමු කළ පසුව තමා විසින් මාළු වෙළඳසැල් හා ජංගම මාළු වෙළඳසැල් නගරයේ කොපමණ තිබේද යන්න තමා විසින් අධික්ෂණය කළ බවත්, ඒ අනුව තලගහ හන්දියේ සිට කීල්ස් වෙළඳසැල දක්වා වෙළඳසැල් 09 ක් ඇති බව තමා හඳුනා ගත් බවත්, නගර සංවර්ධනය කිරීමට සැලසුම් කිරීමට ඇති බවත්, පොළ භූමිය ආර්ථික කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනාවක් ඇති බවත්, ධීවර සංස්ථාව එම ස්ථානයට ගෙන ගොස් ආදර්ශයක් ලබා දී පාර පුරා අක්‍රමවත්ව තිබෙන ධීවර හා මත්ස්‍ය වෙළඳසැල් එක් ස්ථානයකට ගෙන ගොස් ඒ අයට ද පහසුකම් ලබා දී, ධීවර හා මත්ස්‍ය වෙළඳසැල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවක් සභාවේ සම්මත කර ගත් බවත්, ඒ අතුරු ව්‍යවස්ථාව අනුව උපරිම යෝග්‍යතාව අනුව ඒ ස්ථාන සුදුසු පරිදි සකසා දී, වෙළඳසැල් ප්‍රමාණය 10 ක් දක්වා වැඩි කර ගැනීමට පුළුවන් නම් ඒ සංඛ්‍යාව වැඩි කර පාර පුරා සිටින වෙළෙඳුන් එක ස්ථානයට ගෙන්වා ගැනීමට හැකි නම් එය සුදුසු බවත්, ඒ නිසා මෙය ඉතා කාලෝචිත යෝජනාවක් බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා පෙ.ව 11.12 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, හරක් මස් වෙළඳසැලෙන් ඉල්ලීමක් කරඉඇති බවත්, සභාපතිතුමාගෙනුත් එම ඉල්ලිම කර ඇතැයි තමන් සිතන බවත්, තිබෙන නිර්දේශ අනුව ඉදිරිපස වීදුරු යොදා සකස් කර දෙන ලෙසට ඉල්ලීමක් සිදු කර ඇති බවත්, එසේ සිදු නොකර වෙනත් ස්ථානයක් සඳහා යොමු කරනවාද යන්න ගරු සභාපතිතුමාගෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

වීදුරු සවි කර ලස්සනට සිදු කිරීමට කාර්මික නිලධාරී මහතා සමඟ සාකච්ඡා කළ බවත්, පසුගිය කාලයේ පොළට යන ලෙස ඔවුන්ට පවසා සිටියද ඔවුන් අතරින් පැමිණි යෝජනාවක් ලෙස, එහි අනෙක් පස සිට මාළු ලබාගැනීමටවත්

නොහැකි බැවින් පඩි පෙළක් සැදීමට වන බවත්, නමුත් පඩි පෙළක් සැදීම නොගැලපෙන බැවින්, මාළු වෙළඳසැල් සැදීමට යෝජනා කළ බවත්, ඒ අතරතුර හරක් මස් වෙළඳසැල ඒ සමඟ ම අලුත් වැඩියා කළ යුතු බවත්, එම ස්ථානයේම තබා සියළුම වෙළඳසැල් පොළ තුළට ගැනීමට අලුතින්ම තීරණය කළ බවත්, එය හදිසියේ පැමිණි යෝජනාවක් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගියවර සභාවේ පැවසූ කරුණු සභාවේ අයට අමතක ද යන්නත්, සභාවේ සිටින කම්කරුට මාළු වෙළඳසැල ලබාදීමට යෝජනාවක් පැමිණි බවත්, ඒ පිළිබඳව මතක් කර බලන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම කඩ කාමර සඳහා ටෙන්ඩර් කැඳවීමට අපේක්ෂා කරනවාද යන්නත්, එසේ කරනවා නම් ජංගම වෙළෙන්දන් දැනුවත් කිරීමක් කළ යුතු බවත්, ටෙන්ඩර් පටිපාටියට ගිය විට දැනට සිටින වෙළෙන්දන්ට වෙළඳසැල් ලබා ගන්න බැරි වුණොත් කුමක් වෙන්නේ ද යන්නත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

අනිවාර්යයෙන්ම ටෙන්ඩර් කටයුතු සිදු කළ යුතු බවත්, දැනට නගරයේ ඉන්න වෙළෙන්දන් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙන බවත්, දැනට සිටින වෙළෙන්දන්ට ලබා දීම සඳහා ඒ අය සඳහා විශේෂත්වකක් කරනවාද කියා සභාවේ වෙන්ම තීරණයක් ගත යුතු බවත්, පිට වෙළෙන්දන් පැමිණියොත් එපා කියන්න බැරි බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ අදහස අනුවද තමන්ද අදහසක් ඉදිරිපත් කරන බවත්, ඇහැලියගොඩ නගරයේ තිබෙන සියළුම මාලු ලොරි, මාලු කඩ පොළ තුළට රැගෙන යාම සුදුසු බවත්, මෑතකදී මුහුණදුන් අත්දැකීමක් අනුව බෙහෙත් කඩය ඉදිරිපිට මාලු කඩය අසලින් අසාමාන්‍ය ලෙස දුගඳක් හැමූ බවත් මාලු අපද්‍රව්‍ය දැමීම නිසා එසේ සිදුවන්නට ඇති බව එම ස්ථානයේ සිටි පිරිසද පැවසූ බවත්, පිටස්තර ගම්මානයකින් ඇහැලියගොඩ නගරයට පැමිණෙන පිරිස් එම ස්ථානයෙන් බැස ගියහොත් ඇහැලියගොඩ නගරය පිළිබඳව දැඩි අප්‍රසාදයක් හට ගනු ඇති බවත්,රේල් පාරේ මිඩිලක්ඩ හෝටලය පිටුපසද අසාමාන්‍ය දුගඳක් හමන බවත් ප්‍රකාශ කරන ලදී. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පැවසූ පරිදි වහ වහාම ක්‍රියාත්මක වී ඔවුන් හට ටෙන්ඩර් ක්‍රමවේදයකට හෝ මොන යම් හෝ ක්‍රමවේදයකට පොළ භූමියේ අවශ්‍ය ප්‍රමාණයට වෙළඳසැල් සකසා සියලු දෙනාම එම ස්ථානයට ගෙන ඒම සුදුසු බව තම අදහසක් ලෙස ගෙන එන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 11.16 ට සභා ගර්භයෙන් පිට විය.

07 (ix) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ සති පොළෙහි අංක 1 ගොඩනැගිල්ලේ වෙළෙදාම් සිදු කරන වෙළෙදුන්ගේ එළවළු තබා ගැනීමට සුදුසු 6′× 4′× 4′ ප්‍රමාණයේ යකඩ රාක්ක සක්ස් කර ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා පෙ.ව 11.17 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ පොළ සඳහා විශාල ගොඩනැගිලි දෙකක් වෙන් කර තිබුණ ද සීමිත පිරිසක් එහි වෙළඳාම් කටයුතු සිදු කරන බැවින් හා එය සභාවේ වත්කමක් ද බැවින් සමහර ස්ථානවල බිම එළවළු වෙළඳාම් කටයුතු සිදු කිරීම ද දක්නට ලැබෙන බැවින් පිරිසිදුකම සහ සෞඛ්‍යා රක්ෂිත පිළිබඳව ද පොරිහෝගිකයන්ටත් එය අපහසු බවත්, ඒ නිසා පිරිසිදු බව, සෞඛ්‍යාරක්ෂිත බව, පිළිබඳව තමා විශේෂ අවධානය යොමු කරන බවත්, ප්‍රමාණය විශේෂයෙන් සලකා බලා 6x4 ප්‍රමාණයේ රාක්ක සකසා දීම මගින් විශාල වෙළඳුන් ප්‍රමාණයකට ලබාදීය හැකි බවත්, එම ඉතිරි වන ඉඩකඩ වෙනත් කාර්යයක් සඳහා යෙදාගත හැකි බව පිළිබඳවද සලසකා බලා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, දැනට පොළ භූමියේ සිටින වෙළඳ මහතුන් සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කරාද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.19 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

දැනට සාකච්ඡා වට 02ක් පමණ සිදු කර ඇති බවත්, සභාව මගින් එම රාක්ක නොමිලේ ලබාදෙන බවත්, එහි උඩ ලී තට්ටුව ඔවුන්ට සකසා ගැනීමට සිදුවන බවත් වැඩිදුරටත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී .

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, වෙළෙන්දොත් සමඟහ සාකාච්ඡා කර වෙළෙන්දෝ අකමැති වුවත් මෙම යෝජනාව සෞඛ්‍යානුකූලව ඉතාමත් හොඳ යෝජනාවක් බවත්, මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 11.20 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

07 (x) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙහි අංක 136 ඇහැලියගොඩ ග්‍රාම නිලධාරි වසමේ කැන්දන්ගමුව ඉහලගම ගමෙහි ඇහැලියගොඩ පොලිසිය අසලින් ආරම්භ වන හිගුරනගේවත්ත මාර්ගයේ බලයලත් මිනින්දෝරු වයි.ආර්.එන්.ටී රණතුංග මහතා 2024.08.23 දින මැනුම් කරන ලද අනුරේඛන අංක 715 හි හිගුරනගේවත්ත නැමති ඉඩමෙන් ඉඩම් කැබලි අංක 09 හි පර්චස් 0.16 ක ප්‍රමාණය හා ගිලින්ගුවේහ්න නැමති ඉඩමෙන් කැබලි අංක 10 හි පර්චස් 0.36 ක ප්‍රමාණය මාර්ගය අඩි 10 ක් දක්වා පුළුල් කිරීම සඳහා අත්පත් කර ගැනිමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

07 (xi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙහි අංක 136/ඊ පැල්පිටිය ග්‍රාමනිළධාරී කොට්ඨාශයේ පැල්පිටිය ගමෙහි පිහිටා ඇති අයි.පී නවරත්න මහතාගේ නිවස අසලින් ආරම්භ වන පැල්පිටිය කණුකැටිය මාර්ගය කොටසක් දැක්වෙන බලයලත් මිනින්දෝරු එම්.ඩී.පී ජයලත් කුමාර මහතා 2005.07.25 දින මැනුම් කරන ලද පිඹුරු අංක 2230 හි කැබලි අංක 01 හි පර්චස් 01.07 ක ප්‍රමාණය සහ කැබලි අංක 02 හි පර්චස් 02.21 ක ප්‍රමාණය පැල්පිටිය කණුකැටිය මාර්ගය සැකසීම සඳහා පවරා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

08 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජේසිංහ මැතිතුමා.

මීගස්වෙල පන්සල අසල සිට දංකුඹුර දෙසට දිවෙන මාර්ගය මීටර් 300 ක් පමණ දුරකින් යුතු කාණු පද්ධතිය බැකෝ යන්ත්‍රයක් යොදා සකස් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මීගස්වෙල පන්සලේ කාණු පද්ධතියක් නොමැති බැවින් වැසි කාලයේදී සම්පූර්ණයෙන්ම එම ප්‍රදේශය ජලයෙන් යට වීමට ලක්වන බවත්, එම නිසා විධිමත් කාණු පද්ධතියක් තිබීම විශාල පිටුවහලක් බවත්, ඒ සඳහා බැකෝ යන්ත්‍රයක් මගින් කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙම මාර්ගය දෙපැත්තෙන්ම අතීතයේ කාණු පද්ධතියක් තිබූ බවත්, මේවන විට ජනාකීර්ණ වී ඇති නිසා එම කාණු වැසී ගොස් ඇති බවත්, මේ වන විට ඒ ප්‍රදේශයේ විශාල වහයෙන් නිවෙස් ඉදි වී ඇති බවත්, එම නිසා මේ මාර්ගය දෙපසම කාණුව සමඟ බෝක්කුවක්ද යොදා නිසි කළමනාකරණයකින් පසු මාර්ගය සැකසීම වැදගත් බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

09 (i) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘතිය සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රග්ධන ප්‍රධාන ලබාදීම ව්‍යාපෘතිය යටතේ, ඇහැලියගොඩ පොළ ගොඩනැගිල්ලේ ගෘහස්ත ක්‍රීඩාංගනයක් සකස් කිරීම ව්‍යාපෘති යෝජනාව අනුමත වී ඇත. එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු මුදල රුපියල් 20,565,790.00 වේ.මෙම මුදලින් මිලියන දහයක් රාජ්‍ය පරිපාලන පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දෙන බව දැනුම් දී ඇත.ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය වන ඉතිරි මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා පෙ.ව 11.25 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පොළ භූමියේ විශාල ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට භාවිතයට ගෙන නොමැති ඇති බවත්, එය සියලු දෙනා දන්නා කරුණක් බවත් ඒ අනුව එක් ගොඩනැගිල්ලක් පොළේ වෙළඳ ව්‍යාපාරික මහතුන් සඳහා ලබාගත හැකි බවත් ඉතිරි ප්‍රමාණයට පලාත් සභාවෙන් ප්‍රාග්ධන ප්‍රධාන ලබාදීම ව්‍යාපෘතිය යටතේ මිලියන 10 ක මුදලක් ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සඳහා ලැබීමට නියමිත බැවින්, ඒ සඳහා ඉතිරි මුදල සභාවෙන් අනුමත කර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, මෙම ප්‍රදේශය නිතරම වර්ෂාපතනයට ලක්වන මෙම ප්‍රදේශයක් නිසාත්, වැඩි ඉල්ලුමක් මේ සඳහා තිබෙන බැවින්, ගෘහස්ථ ක්‍රීඩාංගනයක් අවට ස්ථාපිතව නොමැති බැවින්ද මෙය උචිත බවත් නිසා මේ යෝජනාව සභා අනුමැතියට යොමු කළ බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ඉතාමත් හොඳ ජනතාවට සේවයක් සැපයිය හැකි යෝජනාවක් බවත්, මිලියන 10 ක මුදලක් සභා අරමුදලට ලැබුණ නමුත් තවත් රුපියල් කෝටියක මුදලක් දැරිය හැකි දැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ඒ වගේ ම මෝරගල ක්‍රීඩාපිටිය සැකසීමේදී එම සැලැස්ම තුළ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිවනවාද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එම මුදල දැරිය හැකි බවත්, මෝරගල ක්‍රීඩාපිටිය සැකසීමේදී එම සැලැස්ම තුළ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදි නොවන බවත්, එය ඉතාමත් හොඳ ප්‍රශ්නයක් බවත්, එම ස්ථානයේ සංවර්ධන යෝජනා 5 ක් යටතේ 25ක් යෝජනා කර ඇති බවත්, මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය වුවත් ගෘහස්ථ ක්‍රීඩාංගනයක් තවම යෝජනා වී නොමැති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා පෙ.ව 11.28 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, නගර සැලැස්ම සම්බන්ධව ලෆායට් හෝටලයේ සංවිධානය කර තිබූ රැස්වීමට තමා ද සම්බන්ධ වූ බවත්, තවම නගර සැලැස්ම දැක නොමැති බැවින් එහි ගෘහස්ථ ක්‍රීඩාංගනයක් එහි සෑදීම පිළිබඳව සඳහනක් තිබේද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

නගර සැලැස්ම ගැසට් කර ගැනීමේ කටයුතු සිදු කර ගැනීමට හැකි වූයේ මෑතකදී බවත්, එම නිසා එය ඉදිරිපත් නොකල බවත් එහි සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, වෙළඳ ව්‍යාපාරික මහතුන් සහ ඇහැලියගොඩ නගරයේ සියලු දෙනාටම මාධ්‍ය මගින් එහි සම්පූර්ණ ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත්, එම මිලියන 250 ක මුදල මෙම වසරේ ඉතිරි මාස කිහිපය නිම වීමට පෙර වියදම් කර අවසන් කරන බවත් මේවන විට එහි පළමු අදියර ලෙස මිලියන 115ක් ආණ්ඩුවෙන් පවරා තිබෙන අක්කර 45හි උඩ තිබෙන මහ ඇළ, ඇහැලියගොඩ නගර සංවර්ධනයේ ප්‍රධන දෙය ජලයෙන් නගරය යට වීම වැළැක්වීම බවත් පසුගිය දිනවල පොලිස් ස්ථානය ජලයෙන් යටවීම සැවොම දක්නට ඇති බවත්, එම නිසා මේ වර්ෂා කාලයට නගරය ජලයෙන් යටවීම නැවැත්විය යුතු බවත්, එම නිසා මේවන විටත් SLDD ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ ආයතනයට භාරදී ඇති බවත්, ඔවුන් මෙම මාස කිහිපය තුළ වැඩ කටයුතු ආරම්භ කරන බවත් මේ වන විට අධ්‍යනය කර අවසන් බවත්, එවිට සම්පූර්ණයෙන් මහ ඇලේ සිට කාණු පද්ධතිය එල්ලාවල ගඟ දක්වා වතුර බැස්සීමේ වැඩ කටයුතු සිදුකරන බවත් එවිට ජලයෙන් යටයීමට ලක් නොවන බවත් ඉතිරි

මිලියන 135ක මුදල මාර්ග සංවර්ධන අධිකාරියට වෙන්කර ඇති බවත්, RD එක ද මේ වන විට මිලියන 225ක් සම්පූර්ණ මුදල යන බව පවසා වෙන් කර ඇති බවත්, එයින් මිලියන 135 ක් ඔවුන් වෙත ලබා දී ඇති බවත්,

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා පෙ.ව 11.29 ට සභා ගර්භයෙන් පිට විය.

ඔවුන්ද මෙම මාස කිහිපය ඇතුළත වැඩ කටයුතු අවසන් කළ යුතු බවත් ඒ සඳහා ඔවුන් පදික වෙළඳසැල් ඉවත් කරන ලෙස ප්‍රාදේශිය සභාවට දැනුම්දී ඇති බවත් නමුත් ඔවුන්ට ප්‍රාදේශිය සභාව විසින් පවසා සිටියේ වැඩ කටයුතු ආරම්භ කරන ලෙසත් ආරම්භ කිරීමට සති දෙකක් තුනක් තිබිය දී අප ප්‍රාදේශිය සභාවත් නාගරිකරික සංවර්ධන අධිකාරියත් එක්ව ප්‍රචාරන කටයුතු සිදුකර එම වැඩ කටයුතු සිදුකර ඔවුන්ට අවශ්‍ය සහාය ලබාදෙන බවත් කඩ කැඩීමට අවශ්‍ය නොවන බවත් අඩි 35ක ප්‍රමාණය ඇති බවත් නමුත් බෝඩ් පාරට කර ස්ථාපිත කර ඇති බවත්, සමහරු පාරේ වෙළඳාම් කටයුතු සිදුකර බවත් එය නිරවුල් කර ලබාදිය යුතු බවත් මෙම ව්‍යාපෘති දෙක මෙම වසරේ අවසන් වන බවත් එවිට නගරයේ එහා කෙලවරේ සිට මෝරගල දක්වා යන තෙක් මාර්ගය මංතීරු 04ක් යටතේ ද, පදික වේදිකාවේ

ගල් ඇතිරීමේ කටයුතු ද සිදුකරන බවත්, පාර පළල් කිරීමට පල්ලිය හා පන්සල සමඟ සාකච්ඡා කරමින් පවතින බවත් එම ආගමික ස්ථාන දෙකෙන් සුභදායී පණිවිඩ ලැබෙයි කියා බොහෝ දුරට බලාපොරොත්තු වන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවට තමන් විරුද්ධ නොවන බවත් නමුත් කෝට් දෙකකට වැඩි මුදලක් ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා වෙන් කරන බවත් පෙර පැවති ආණ්ඩුවේ නගර සංවර්ධන සැලැස්ම අනුව එහි පොළ භූමිය ඉදිවී ඇති බවත් නමුත් මේ යෝජනාව අනුව ව්‍යුහාත්මක වෙනසක් සිදු වන බවත්, එහි දැනට තිබෙන ගොඩනැගිලි දෙකෙන්

එකක් සම්පූර්ණයෙන් වෙනස්කර මෙම කෝට් දෙකක මුදල ආයෝජනය කරනවා විය හැකි බව තමන් සිතන බවත්, එසේ වෙනස් නොකරනවා නම් කෝට් 2 ක මුදලක් අවශ්‍ය නොවන බවත්, තමන් විසින් වශ්වාස කරන පරිදි මෙම ඇහැලියගොඩ ජීවත්වන පුරවැසියෙක් ලෙස මෙම කෝට් දෙකක මුදල ඉතාමත් හොඳ ආකාරයකට යෙදවීම ප්‍රමාණවත් බවත් මෝරගල ක්‍රීඩාපිටිය තුළ මෙම ගෘහස්ථ ක්‍රීඩා භූමියක් ඉදිකල හැකිනම් අනාගතයේ මතුවන ගැටළු යම්තාක් අඩුකරගත හැකි බවට තමන් සිතන බවත් ප්‍රාදේශිය සභාවට අයත් පොළ භූමියේ ගෘහස්ත ක්‍රීඩාංගනය ඉදිකිරීමට විරුද්ධ වන තත්වයක් නොවන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රීඩා භූමියට ගෙන ගියහොත් මීට වඩා හොඳ අවස්ථාවක් බවත් ඒ සඳහා මැදිහත්ව ආණ්ඩුවේ අවධානය යොමු කරන ලෙස ගරු සභාපතතුමාගෙන් ඉල්ලා සිටින බවත් තම අදහස මෙම ව්‍යාපෘතිය ක්‍රීඩාභූමිය ගෙන ගියහොත් මීට වඩා හොඳ ආයෝජන අවස්ථාවක් බවත් වාහන පාකින් කිරීමට හැකි වීම ,අනෙක් ක්‍රීඩා සමඟ ගැලපීම වැනි දේ නිසා තමන්ට විශ්වාසයක් ඇති බවත් ක්‍රීඩා භූමියේ සැලැස්මේ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම පිළිබඳව සඳහන්ව නොමැත්තේ ඇයි ද යන්න ප්‍රශ්නයක් තිබෙන බවත් කෝටියක් වියදම් කරන විට එම කෝටියක මුදල නැවත සභාව වෙත ලබාගත යුතු බවත් එය ලබාගන්නේ කුමන කාලයේද කියා ගැටළුවක් ඇති බවත් ඒ පිළිබඳවද සැලකිලිමත් වන ලෙස ඉල්ලා සිටින බවත් වැඩිදුරටත් ගරු ප්‍රාදේශය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා පෙ.ව 11.32 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් මිලියන 10 ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා යෝජනා ලබා දෙන මෙන් දන්වා තිබූ බවත් ඒ සඳහා අප විසින් යෝජනා 03ක් ඉදිරිපත් කළ බවත් ඉන් එක් යෝජනාවක් මෙම යෝජනාව බවත්,

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා පෙ.ව 11.34 ට සභා ගර්භයෙන් පිට විය.

ඇහැලියගොඩ පොළ භූමියේ කිසිඳු ප්‍රයෝජනයකට නොගන්නා එක් ගොඩනැගිල්ලක් තිබෙන බවත්, එහි වෙළෙන්දන්ද නොමැති බවත් ,විදුලි බිලද ගෙවා ගැනීමවත් එයින් මුදල් නොලැබෙන බවත්,එතන මුලින් ප්‍රාදේශිය සභාවට අයත් ක්‍රීඩා පිට්ටනිය තිබූ බවත්, පසුව එහි ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කිරීමට තරම් විශාල ගොඩනැගිල්ලක් ඉදි කළ බවත්, අනාගතය පිළිබඳ සකාෘතා අධ්‍යනයකින් තොරව එය කිසිම තේරුමක් නැති ආකාරයෙන් කළ ඉදි කිරීමක් බවත්, ඌණ උපයෝජිත එම ගොඩනැගිල්ලට, ඇහැලියගොඩට ගෘහස්ථ ක්‍රීඩාපිටියක් අහඝාතාවයක් පවතින බවත්,

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා පෙ.ව 11.35 ට සභා ගර්භයෙන් පිට විය.

මින් පෙර දන්දෙනිය ප්‍රදේශයේ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් තිබූ බවත්, එය ප්‍රදේශවාසින්ගේ විරොධය මත එය ඉවත් කළ බවත්. එතන හොඳ ආදායමක් තිබූ බවත්, මෙහි ගණන් බලූ විට වොලිබෝල් පිට්ටනියක් ,බැට්මින්ටන් පිට්ටනි දෙකක්, එම දෙකම ඉවත් කර ක්‍රිකට් සෙල්ලම් කිරීමට හැකි බවත්,ටේබල් ටෙනිස් ක්‍රීඩා කිරීමට හැකි බවත් ඒ අනුව එකවර

ක්‍රීඩා දෙක තුනක් සිදුකළ හැකි බවත්, උදේ 8.00 සිට මෙය ලබා දීමට හැකි බවත්, පාසල් දෙකක් හා වාහන නැවැත්වීමේ පාකින් එකක් ඇති බවත් ඒ අනුව පොළ සඳහා ද සෙනහ ගෙන්වා ගැනීමට හැකි බවත් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස මෙයින් විශාල මුදලක් ලබාගත හැකි බවත්, වසර පහක් පමණ ගත වන විට අප ප්‍රාදේශිය සභාව මගින් යොදවන මුදල පමණක් නොව අමාත්‍යාංශයේ මුදල්ද පියවීමේ හැකියාවක් ඇතිවන බවත්,

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 11.36 ට සභා ගර්භයෙන් පිට විය.

එම නිසා මෙම මුදල සභා අරමුදලින් දරා ඉක්මනින්ම අනිවාර්යයෙන්ම සිදු කරමු කියා ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කළ අතර, මේවන විටත් ඇහැලියගොඩ ජාතික පාසල හා ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලය බැට්මින්ටන් පුහුණුව සඳහා පොළ භූමිය ඉල්ලා සිටින බවත්,

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා පෙ.ව 11.37 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මේ සඳහා ලිපිය ලද වහා ම ක්‍රියාත්මක වී අමාත්‍යාංශ ගණනාවකම අනුමැතිය ලබාදී රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය සභා17 න් ප්‍රාදේශිය සභා 8 කට වැතර අදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලැබුණු බවත්, ඇහැලියගොඩට අනුමත වූ ව්‍යාපෘතිය එය බවත්, හැකියාවක් ඇති නිසා එය අනුමත කර ඇති බවත්, සභාවෙන වෙන් කරන මුදල අපතේ යැමක් සිදු නොවන බවත්, එම නිසා මෙම කාර්යය සඳහා ලිපි පැමිණි විගසම කටයුතු කරමු කියා ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා පෙ.ව 11.38 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙම පොළ භූමියේ නාගරික සංවර්ධන අධිකාරියට කොටසක් අයත් වනවාද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පොළ භූමියේ නාගරික සංවර්ධන අධිකාරියට කොටසක් අයත් නොවන බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙම මුදල් යොදවා තිබෙන්නේ එළවළු වෙළඳසැල් සඳහා පමණද ඉදිරියේදී යම් කිසි ගැටළුවක් පැමිණියහොත් ඒ සඳහා අප මුහුණ දිය යුතු නිසා එම ප්‍රශ්නය යොමුකල බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ආදායම් උත්පාදනය කරගැනීම සඳහා මෙම මුදල් යොදවන බැවින් ඒ සඳහා අමාත්‍යාංශයෙන් ලබාදෙන මුදල් මෙපමණකැයි ඉතිරි මුදල සභාවෙන් යොදවන බැවින් එම යොදවන මුදල වසර 05ක් තුළ එම ආයතනය වෙත පැවරීමට හැකියාවක් තිබේද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විමසා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරීම සඳහා පොළ භූමිය පෙර සංවර්ධන සැලැස්මේ තිබූ බවත් හිරිපිටිය, කොස්ගම දැනට ආර්ථික මධ්‍යස්ථාන තිබෙන බවත්,කෙසේ වෙතත් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පොළ භූමිය ඉදිකිරීම සම්බන්ධව විරෝධතාවයක් නොමැති බවත් නමුත් නගර සංවර්ධන සැලැස්ම සඳහා හැකිනම් මෝරගල ක්‍රීඩා පිටිය තුළත් ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකරන ලෙසත් එය සංකල්ප ලෙසත් සිද්ධාන්ත ලෙසත් ලොකු වටිනාකමක් ඇති කළ හැකි බවත්, ඒ සඳහා ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා පෙ.ව 11.40 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.40 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පොළ භූමිය සඳහා වෙන්වන මිලියන 10ක මුදල ප්‍රාදේශිය සභාව සඳහා වෙන්වන මුදලක් බවත් ඉතිරි මුදල ප්‍රාදේශිය සභාව මගින් යෙදවිය යුතු බවත් රංජිත් මන්ත්‍රීතුමා පැවසූ පරිදි පොළ භූමිය හා එහි ආදායම සම්පූර්ණයෙන්ම ප්‍රාදේශිය සභාව සතු වන බවත් ආදායම් උත්පාදනයේදී එහි ආදායම සම්පූර්ණයෙන්ම ප්‍රාදේශය සභාවට ලබාගත හැකි බවත් නමුත් අක්කර 45 අපට අයත් නොවන බවත් එහි සංගීත ප්‍රසංගයක් පැවතියද එයින් පොඩි මුදලක් පමණක් අපට ලැබෙන බවත් එහි සම්පූර්ණ ආදායම නාගරික සංවර්ධන අධිකාරිය ලබාගන්නා බවත් නගර සැලැස්මේද එලෙස ගෘහස්ථ ක්‍රීඩාංගනයක් පිළිබඳව සඳහන්ව නොමැති බවත් අනෙක් කරුණ ලෙස මෙම මුදල මෙම වසරේ ලද මුදලක් බවත් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව විසින් යෝජනා 03ක් ඉදිරිපත් කල බවත් ඒ අනුව සූර්ය පැනල යෝජනාව,ඇහැලියගොඩ කොළඹ බස් රථ දෙකක් ලබාගැනීමේ යෝජනාව හා ගෘහස්ථ ක්‍රීඩාංගනය එම යෝජනා තුන බවත් වැඩිදුරටත් එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 17කින් 08ක් පමණක් තෝරාගෙන එයිනුත් යෝජනා දෙකක් ප්‍රතික්ෂේප වී ඉතිරි වූ යෝජනාව මෙම ගෘහස්ත ක්‍රීඩාංගනය ඉදිකිරීමේ යෝජනාව බවත් ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව කාලෝචිත බවත් එම මුදල් ලැබෙන බවත් නාගරික සංවර්ධනයේ ප්‍රමුඛතාගත කිරීමේදී ඊලඟ වසරේදී ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගරු ඇමතිතුමා මාර්ගයෙන් වෙනම මුදලක් ලැබෙන බවත් ඊට අමතරව වෙනත් කටයුතු ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එම නිසා ඒ සඳහා ප්‍රමාදයක් ඇති බව බැවින් මෙහි බලාපොරොත්තුව මුදල් උපයා ගැනීම හා ප්‍රේද්ශයේ වැඩිම වර්ෂාපතනයක් තිබෙන නිසාත් මෙම කරුණ කිරීමට යෝ බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා පෙ.ව 11.42 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

නගර සංවර්ධන සැලැස්ම සඳහා ද ගරු සභාපතිතුමා මැදිහත් වී ගෘහස්ථ ක්‍රීඩාංගනයක් මෝරගල ක්‍රීඩාපිටිය සඳහා ද යෝජනා කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.43 ට සභා ගර්භයෙන් පිට විය.

(උ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

i.	මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තා	-ඇමුණුම් ලේඛනය i / ii
ii.	මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව	-ඇමුණුම් ලේඛනය iii / iv
iii.	නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව	-ඇමුණුම් ලේඛනය v
iv.	පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව	- ඇමුණුම් ලේඛනය vi
v.	කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව.	- ඇමුණුම් ලේඛනය vii

(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

i.	2026 මැයි මස ආදායම් වියදම් වාර්තාව.	- ඇමුණුම් ලේඛනය x
ii.	2026 මැයි මස හිඟ ආදායම් වාර්තාව.	- ඇමුණුම් ලේඛනය xi
iii.	2026 මැයි මස ගෙවීම් වාර්තාව.	- ඇමුණුම් ලේඛනය xii

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
පුස්තකාල කාරක සභා යෝජනා අවස්ථාවේ තමා ආවේගයෙන් කතා කිරීම සම්බන්ධව සමාව ඉල්ලා සිටින බවත්, මේ මොහෙතේ නැවත ඒ සම්බන්ධව අදහස් දැක්වීම අවශ්‍ය නැති බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාව මධ්‍යාහ්න 12.00 ට තේ පැන් සංග්‍රහය සඳහා විනාඩි 20 කට කල් තැබීමට ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.06.09 වන දින සාමාන්‍ය සභා රැස්වීම පෙ.ව 11.45 සිට තේ පැන් සංග්‍රහය සඳහා විනාඩි 20 කට කල් තබන ලදී.

තේපැන් සංග්‍රහයෙන් පසුව මධ්‍යාහ්න 12. 05 ට නැවතත් 2026.06.09 දින සාමාන්‍ය සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

(ඒ) සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේවන විටත් මන්ත්‍රීවරුන් කිපදෙනෙක් සභාව තුළ නොමැති බවත්, සභා රැස්වීම මාසෙකට වරක් පමණක් සිදු කරන බැවින් ඒ සඳහා සියලු දෙනාම සභාව අවසන් වන තෙක් රැදි සිටීම සුදුසු බවත්, නොයෙසේ නම් තමාගේ කතාව පමණක් සිදු කර පිටව යන බවත්, එවිට සභාවේ මන්ත්‍රී පිරිස ටික ටික අඩු වන බවත්, එම නිසා එසේ නොකර සභාව අවසන් වන තෙක් සියලු දෙනාම රැදි සිටීමට කටයුතු කරන ලෙසට කරුණාවෙන් ඉල්ලා සිටින බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.චත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ගරු සභාපතිතුමනි, කාරක සභා වර්තා ලැබෙන්නේ සභාව දින උදේ බවත්, කාරක සභා වාර්තාවල විශේෂිත කාරක සභා වාර්තාව වන මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව බවත්, ඊයෙ අවසාන කාරක සභාව පැවති බවත්, එම වාර්තා හැකි ආකාරයට සභාවට පෙර ලබා දීමට කටයුතු කරනවා නම් එය සාර්ථක බවත්, මෙම වාර්තා ප්‍රින්ට් කිරීමේදී ඉලක්කම්වල වැරදී වෙන්න පුලුවන් බවත්, එම වැරදි වාර්තා එම නිසා අනුමත වෙන්න පුළුවන් බවත්, ඒ තත්ත්වය යම්තාක් දුරට වලක්වා ගැනීමට වාර්තා කලින් ලබා දෙනවා නම් සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.චත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

මින් ඉහත දිනකදීත් සඳහන් කළ පරිදි නැ/ විලේගොඩ වසමට අයත් අක්කර 3 ප්‍රදේශයේ කාණු පද්ධතිය සංවර්ධනය කළ යුතු බවත්, මේ ප්‍රදේශයේ එක ළඟ එක ළඟ නිවාස ඉදි කර ඇති බවත්, ඒ අතර කාණු පද්ධති සකස් වී ඇති බවත්, නිවෙස්වලින් බැහැර කරන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඒ කානු හරහා බැහැර කරන බවත්, ඒ නිසා ඒ ප්‍රදේශය දුගඳ හමන බවත්, මැස්සන්, මදුරුවන් බෝ වී ඇති බවත්, ඒම නිසා මේ කාරණාව සම්බන්ධව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය දැනුවත් කරන ලෙසත්, මේ කාණු පද්ධතිය නිසි ලෙස සකසා දෙන ලෙස එම ජනතාව ඉල්ලීමක් කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.චත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

මෝරගල හොරගොඩ මාර්ගයේ ලක්ෂ විස්සක පමණ යොදවා සිදු කර ඇති පාලම සම්බන්ධව සතුටු වන බවත්, එය තමාගේ පළමු යෝජනාව බවත්, ඒ සඳහා විශේෂ ස්තුතිය පුද කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.චත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

පරිසර දින වැඩසටහනක් සභාව මඟින් සිදු කර ඇති බවත්, එවැනි වැඩසටහන් සිදු කිරීම ඉතාම හොඳ බවත්, මේ වැඩසටහන සඳහා පරිසර කමිටුවේ සාමාජිකයන් පමනක් සහභාගි කරවාගෙන තිබීම මෙහි අඩු පාඩුවක් ලෙස දකින බවත්, සියලු මන්ත්‍රිවරු මේ සඳහා සහභාගී කරවා ගෙන නගරය පුරා ම දැනුවත් කිරීම් සිදු කළා නම් මේ වැඩසටහන මීට වඩා සාර්ථක වෙයි කියලා සිතන බවත්, නමුත් මෙය කෙසේ සිදු වුවා ද යන්න තමා නොදන්නා බවත්, සභාවට පැමිණි විට සභාපතිතුමා සමඟ පෞද්ගලිකව කතා කරන විට ඔබතුමාගෙන් පුදුම සහයෝගයක් ලැබෙන බවත්, නමුත් මේවා සංවිධානය වෙන්නේ කොහෙන්ද,? ඒ සම්බන්ධව සාකච්ඡා සිදු කර මන්ත්‍රිවරු සම්බන්ධ කර ගන්නේ කෙසේද යන්නත් තමා නොදන්නා බවත්, මාලිමා කට්ටිය කුහක බවට මතයක් තිබෙන බවත්, අන්න ඒ කාරණාව මෙතනදී තමන් දකින බවත්, ඒ හෙතුව නිසාද අනෙක් මන්ත්‍රිවරුන්ට කියන් නැත්තේ යන්නත්, වැඩ සටහනක් කරන විට මෙය පේද්ගලිකව සිදු කරන බවත්, මේ රජය අනෙක් මන්ත්‍රිවරු සම්බන්ධ කර නොගන්නා බවත්, මෙවැනි වැඩසටහන්වලදී අනෙක් මන්ත්‍රිවරුන්ගේ ද සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීමට ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙසට ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.චත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප.ව 12.11 ට සභා ගර්භයෙන් පිට විය.

හෝමියෝ පෙති ලබා ගන්නා ප්‍රතිකාර මධ්‍යස්ථාන පිළිබඳව විස්තරයක් සහික වට්ස්ඇප් සමූහය වෙත යොමු කල බවත්,මෙහි 5000 ක් පමණ මාසිකව ප්‍රතිකාර ලබල බවත්, ඊට අමතරව මාස තුනෙන් තුන හතරෙන් හතර පැමිණෙන අය සිටින බවත්, දහ පහළොස් දාහකට වැඩිය ප්‍රතිකාර ලබන මධ්‍යස්ථානයක් බවත්, මෙය රැකගන්න ඕන කියන වගකීම තිබෙන බවත්, මෙය කුරුවිට ප්‍රාදේශිය සභා බලප්‍රදේශයේ වුණත්, දැනට ඇහැලියගොඩ ප්‍රදේශයේ ජනතාව විශාල ප්‍රමාණයක් ප්‍රතිකාර ලබා ගන්නා බවත්, මෙම ප්‍රතිකාර ක්‍රමය හොඳ එකක් බවත් එය වැසි ගිය හොත් විශාල ප්‍රශ්නයක් බවත්, ජනාතාව ප්‍රකාශ කරන බවත්, එයට හේතුව වන්නේ මෙහි සිටින වෛද්‍යවරයා විදේශගත වන බවත්, ඉන්පසු එම ස්ථානයට යෙදවීම සඳහා වෛදයවරයෙක් නොමැති බවත්, කියන කාරණය තිබෙන බවත්, මේ සඳහා විශේෂ අවදානයක් යොමු කර, ඉහළ දේශපාලන අධිකාරිය දැනුවත් කර මේ සඳහා ගත හැකි පියරක් ගන්නා ලෙසට ඉල්ලිමක් කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.චත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප.ව 12.12 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ඇහැලියගොඩ නගරයේ පහළ ප්‍රදේශයේ දුම්රිය රක්ෂිතයේ තිබූ පොදු වැසිකිලිය තිබූ අපේ සභාවට අත් ඉඩම මේවන විට අන්සතු කර ඇති බවත්, එය අන්සතු වුණේ කොහොමද? ඒ කාලේ සභාවේ සිටි නිලධාරින් ඒ සඳහා මැදිහත් වුණාද? ඒ කාලේ මොන මන්ත්‍රිවරුද මේක කළේ? මොන සභාපතිවරයාද මේක කළේ? මේක සභාවට තිබූ දේපළක් බවත්, ඒ දේපළ සභාවට නැති වී ඇති බවත්, මේ සම්බන්දව සොයා බලන ලෙසට ලේඛම්තුමාගෙන් ඉල්ලිමක් කරන බවත්, මෙ කවුරු හරහා දුන්නා? එවකට හිටිය ආන්ඩුකාරතුමාගෙන් අවසර ගත්තාද? කොහොමද වුණේ කියලා සොයා බලා බලා මේ සම්බන්ධ තොරතුරු නැවත සබා රැස්වීමක දී ඉදිරිපත් කරන ලෙසට ඉල්ලිමක් කරන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් හෝමියෝපෙති සෞඛ්‍ය මධ්‍යස්ථානය පිළිබඳව තමන් පෞද්ගලිකව කතා කල බවත්,කුරුවිට සභාවෙත් මේ සම්බන්ධව සාකච්ඡා කර ඇති බවත්, එය පවත්වාගැනීම කුරුවිට ප්‍රාදේශිය සභාවට අවශ්‍ය කරුනක් වී ඇති බවත්, ඒ සම්බන්ධව කටයුතු කිරීමට තමාද උනන්දුවන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, නිවාස හා ප්‍රජාව සම්බන්ධව කතා කිරීමේ දී ගස් ප්‍රශ්නය විශාල ගැටලුවක් වී ඇති බවත්, මිනිසුන් දැනුවත් කර සිහි කැඳවීම් කර අවසන් ලිපියත් යැවූ පසුත් එම කාර්ය සිදු වන්නේ නැති තත්ත්වයක තිබෙන බවත්, මේ සඳහා විකල්පයක් සකසා ගත යුතු බවත්, නැතහොත් සභාවට චෝදනා එල්ල වන බවත්, ඒ චෝදනා කිරීම බරපතල ආකාරයට ම සභාවට චෝදනාව එල්ල වන බවත්, එම නිසා සභාවට ගස් කපන්නෙක් බඳවා ගෙන එම ගස් කපා දැමීමට හෝ වැනි යම් වැඩපිලිවෙලකට යායුතු බවත්, නැතහොත් මේ ක්‍රියාවලිය අසාර්ථක බවත්, සභාව හැටියට මෙය සාකච්චා කර තීන්දුවක් ගත යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පොළ භූමියට මෙහා පැත්තෙ නඩු කියා ගත් ඉඩම සම්බන්ධව එහි ඉදිරි කටයුතු පිලිබඳත්, ගැටලු මතු වී තිබේ නම් එය විසඳා ගන්නේ කෙසේද යන්න පිලිබඳවත් මේ සභාව දැනුවත් කිරීමක් කිරීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා සංවර්ධන වැඩ කටයුතු ඉතා සාර්ථක බවත්, මාලිමා ආණ්ඩුව ඉතා කුහක ලෙස ප්‍රකාශ කළත්, එක්සත් ජාතික පක්සයෙන් ඡන්දය ඉල්ලූ අපේක්ෂකයෙකුගේ නෝනට අනුරාධපුරයේ නිවසක් ඉදිකර පරිත්‍යාග කරනවා ඔබලා දකින්නට ඇති බවත්, ඇහැලියගොඩත් පක්ෂ දේශපාලනයක් නොමැති බවත්, සුදුසුසාට සුදුසු දේ දීමට කටයුතු කරන බවත්, එසේ ගැටලු තිබෙනවා නම් සභාවට ඉදිරිපත් කරන ලෙසත්, එම ප්‍රකාශය පිළිබඳව කුහකයි කියන එක සම්බන්ධව අර්ථ විවිධාකාරයෙන් ඉදිරිපත් කළ හැකි බවත්, කුහකත්වය ඉවත් කර සාධාරණත්වය වෙනුවෙන් ක්‍රියා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට ගොඩක් චෝදනා එන බවත්, ගාමිනි කියන පුද්ගලයා අවුරුදු ගණනක සිට කොස් ගහකට කළ ඉල්ලිමක් පිලිබඳව මේ ළඟදි දවසක සභාවට ආ බවත්, ඒ පිලිබඳව ක්‍රියාත්මක නොවී තිබූ බවත්, ඒ හේතුවෙන් එම ගස කඩා වැටී අලාභ හානි සිදු වී ඇති බවත්, එවැනි ම බොහෝ සිදු විම් තව තිබෙන බවත්, මේ ක්‍රියාවලිය ඉදිරියට කර ගෙන යැම ඉක්මන් කළ යුතු බවත්, නැත්නම් ප්‍රාදේශිය සභාවට දෝෂාරෝපණ එල්ල වෙන බවත්. ඒ පිලිබඳව ඔබතුමාගේ විශේෂ අවදානය යෝමු කරන ලෙසට ඉල්ලිමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මිටිපොල දොලේ කඩේ අසල තිබෙන පාලමේ පැති බැම්ම සංවර්ධනය කළ යුතු බවත්, මෙය පළාත් සභාව හරහා කළ යුතු බවත්, ඒ පිළිබඳවත් ඔබතුමා අවදානය යෝමු කර පළාත් සභාව හරහා ඒ කටයුත්ත සිදු කිරීමට කටයුතු කරන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

කිරීපෝරුව ඇරැපොල මාර්ගයේ සංවර්ධන කටයුතු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත්, තමන් බලාපොරොත්තු වුයේ උපසභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ඒ මාර්ගය කාපට් කරයි යනුවෙන් බවත්, ඒ පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස ඉල්ලන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සභාපතිවන ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව පිළිබඳව අවදානය යොමු කරන ලෙස නැවත වරක් මතක් කරන බවත්, ඒ පිළිබඳව ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේ ගස් ප්‍රශ්නය සභාවේ තිබෙන විශාල ගැටලුවක් බවත්, සභාවක් විදිහට අපි කොච්චර කිවුවත් ගොඩක් අය මේ ගස් කපලා නැති බවත්, සභාපති වන තමාට එක්කම බැනලා යන බවත්, විෂය නිලධාරීතුමියටත් මේ ළඟදි දිනක බැනලා ගිය බවත්, සැපයුම්කරුවන් ලියාපදිංචි මුදල ගියවර සභාවේ දී ඉතා අඩු මුදලකට අඩු කළ බවත්, මන්ත්‍රීවරු දන්නා ගස් කැපුම්කරුවන් සිටි නම් ලියාපදිංචිය සඳහා යොමු කරන ලෙසත්, මේ කැපුම්කරුවන්ට කාර්ය කළ පසු මුදල් ගෙවීමට

සිදුවන බවත්, ඔවුන් දෛනික වැටුප් ලබන බැවින් ඔවුන් මුදල් ඒ මොහොතේ බලාපොරොත්තු වන බවත්, මෙය එක් පුද්ගලයෙකුට කළ නොහැකි බවත්, එම පුද්ගලයින් කිපදෙනෙකුට මාසෙකට පමණ වැඩ තිබෙන බවත්, එම මුදල් මුදල් කාරක සභාව හරහා ඉක්මනට අනුමත කර දීමට හැකි වන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

අත්තිකාරමක් හරහා මෙය ලබා දෙන්න බැරිද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසන ලදි.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අත්තිකාරමක් හරහා මෙය ලබා දෙන්න බැරි බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ඒ වගේ රැකියාවල් කරන අය උදේ වැඩ කරලා හවස වැඩ කරලා ඉවර වුනහම අනිවාර්යෙන් ම මුදල් අතට ඕන.ඒ අයට ඊට පස්සෙ තියෙනවා වෙන ම වැඩ කොටසක් තිබෙන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මිළ ගණන් කැඳ වුවාට පස්සේ ඒ පුද්ගලයින් ලබා දෙන මිළ ගණන් අනුව පස්සෙ අත්තිකාරමක් ගන්න පුළුවන් කියල ලේකම්තුමත් කිවු බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, දෙහිඔවිට ගම්සභාව මඟින් පනාවල කෝරලයේ 1980 ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට පොළ භූමිය පවරා දුන් බවත්, 2015 දෙවැනි මාසේ තෙක් ම පොළ භූමියක් ලෙස පවත්වාගෙන ගිය බවත්, 2025 සිට නඩු කටයුත්තක් සඳහා පැවරීමක් සිදු වන බවත්, 2026 තුන්මාසේ විතර මැනුම් කටයුතු කරල පවරා ගත් බවත්, නමුත් එම ස්ථානයේ කිසිම අයිතිකාරයෙක් ඉදිරිපත් නොවූ පර්චස් 11 භූමි ප්‍රමාණයක් තිබෙන බවත්, එම ප්‍රමාණය දැනට කවුරු හෝ වෙන් කිරීමක් සිදු කරගෙන තිබෙන බවත්, නමුත් එසේ කොටු කර ගැනීමට කිසිදු පුද්ගලයෙකුට අයිතියක් නොමැති බවත්, නමුත් අවුරුදු 45 ක් සභාව බුක්ති විඳපු පොළ භූමියට, බුක්තියට සරිලන ආකාරයට සභාවට එයට හිමිකම් කිමට ඉහැකි බවත්, ඊට පසු වෙන පාර්ශවයකයට හිමි කමක් තිබෙනවා නම්, එහි අයිතිය සනාථ කර පැමිණුණොත් දිමට හැකි බවත්. පර්චස් එකක් කෝටියක් ලෙස ගණන් බැලුවත් කෝටි 11 බවත්, එය පවරා ගැනිමට ක්‍රමවේදයක් තිබේ නම් එය පවරා ගැනිමට කටයුතු කර ඒ භූමි ප්‍රමාණයත් සභාවට පවරා ගැනිමට කටයුතු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා ප.ව 12.24 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය නිවරදි බවත්,ඒක සභාවට පවරා ගන්න පුලුවන් බවත්, ඒ ක සභාවට වටින බවත්, ඒක අද හදිසි යෝජනාවක් ලෙස එය සභාවට යොමු කරන්න සැලසුම් කලත් එය නොදැමු බවත්, නැවත සභාවෙන් නඩු මාර්ගයකට

ප්‍රවිශ්ඨ වුණොත් නැවත ටික කාලයකට ඒ ප්‍රශ්නය ඇදෙයි කියලා සිතු බවත්, නාගරික සංවර්ධන අධිකාරිය හරහා මෙය ඉක්මනට කර ගැනිමට හැකියාවක් තිබෙන බවත්, නාගරික සංවර්ධන අධිකාරියේ පනත හරි බලවත් බවත්, ඒ හරහා මෙය අත්පත් කර ගැනිමට සැලසුම් කල බවත්. ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේ ඉඩම සඳහා කිසිවෙකුට අයිතියක් ලබා දි නොමැති හෙයින් මේ සඳහා නඩු මාර්ගයකට පිවිසිම අවශ්‍ය නැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප.ව 12.25 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේ සඳහා ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගැනිමට කටයුතු කරන බවට ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මොරගල ක්‍රීඩාපිටිය අසල කාණු පද්ධතිය සම්බන්ධව මීට ඉහත සභා වාර කීපයතදීම අදහස් දැක් වූ බවත්, එම කාණු වැසි දවස්වල පීරියාම නිසා ලොකු ප්‍රශ්නයක් වූ බවත්,ග්‍රාම නිලධාරි මහතා විසින් UD එකේ මහතුන් ද ගෙන්නා ගත් බවත්, මෙය පිරිසිදු කිරීමට UD එක කැමැත්ත ප්‍රකාශ කළ බවට ආරංචියක් ආ බවත්, මේ ළඟදී උපසභාපතිතුමා මෝරගල රහස් රැස්වීමක් කැඳවා ඒ බව ප්‍රකාශ කර ඇති බවත්, ඒ සම්බන්ධව තමාට කිසිම දැනුවත්

කිරීමක් කර නොමැති බවත්, රැස්වීම පැවැත් වුයේ තමාගේ නිවස අසල බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා ප.ව 12.27 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මහජන ක්‍රීඩාපිටියට යන මාර්ගය සඳහා ද ලක්ෂ 20 ක් ලැබී ඇති බවත්, එය තමා කලින් සභාවක කළ යෝජනාවක් බවත්, ඒ සඳහා කොන්ත්‍රාත් මහතෙකු අත්සන් කළා කිවු බවත්, මෝරගල වසමේ සංවර්ධන නිලධාරීතුමිය ඒ බව සඳහන් කළ බවත්, එම මාර්ගය මනින අවස්ථාවේ තමන් ඒ ආසන්නයේ සිටි බවත්, තමන්ගේ නම් ගම් යොදා ගැනීමට අවශ්‍ය නොවන බවත්, ගමට සේවයක් ඉටු විය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා ප.ව 12.29 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාප.ව 12.29 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කළා සභාවෙන් හෝ වියදම් දරා අනතුරුදායක ගස් ඉවත් කළ යුතු බවත්, අනතුරුදායක ගස් කැපීම සම්බන්ධව තීර්ණයක් ගෙන එම ගස් කපා දැමීමට අවශ්‍ය කටයුතු කළ යුතු බවත්, නිවාසවලට, ජීවිතවලට

හානියක් වූ විට සභාවට එය විශාල හානියක් වගේ ම බලපෑමක් වන බවත්, ඒ සඳහා යහපත් විසඳුමක් ලැබෙයි කියා බලාපොරොත්තු වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

වත්සලා මන්ත්‍රීතුමිය විසින් සඳහන් කළ හොරගොඩ පාලම සඳහා රුපිටල් ලක්ෂ 20 ක මුදලක් ලැබුණු බව පැවසු නමුත් එය නිවරදි විය යුතු බවත්, ඒ සඳහා ලක්ෂ 20 ක් නොව එක්කෝටි විසිලක්ෂ ගණනක් ලැබුණු බවත්, බඩුවල මිල ගනන් වෙනස් වූ බැවින් මේවනවිට ඇස්තමේන්ව සංශෝධනය කර අනුමත කිරීමට යොමු කල බවත්, ඒ සඳහා මේ වන විට මුදල් අනුමත වී ඇති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.

මාර්ග කම්කරුවන්නොමැතිකම සභාවේ ලොකු අඩු පාඩුවක් බවත්, මාර්ග තනතුරු සභාවෙන් පුරවා ඇතත් එම පුද්ගලයින් ස්ථානගත කළ යුතු තැන්වලට ස්ථානගත කර නොමැති බවත්,එම පිරිස් පුස්කාලයේ, මුරකරු, වගේ ස්ථානවල ස්ථානගත වී ඇතත්, එමනිලදාරින් නැවත එම ස්ථානවලින් ඉවත් කළ නොහැකි බවත්, එමනිසා වත්සලා මන්ත්‍රීතුමිය ප්‍රකාහ කල ආකාරයට කාණුවක් ගොඩ දා ගන්නවත් සභාවේ මාර්ග කම්කරුවන් නොමැත් බවත්, ඒ මාර්ග කම්කරු තනතුරට අනුමත කාර්ය මන්ඩලයේ අනුමැතියක් තිබේ නම් මාර්ග කම්කරුවන් කිපදෙනෙක් හෝ බඳවාගෙන මේ සඳහා විසඳුමක් ලබා දීමට කටයුතු කරන ලෙසත්, අක්කර 3 ප්‍රදේශයේ ප්‍රශ්නය සඳහා තමන් කාර්මික නිලධාරි මහතා සමඟ ගොස් ස්ථානිය පරීක්ෂණයක් සිදු කළ බවත්, සභාවේ මාර්ග කම්කරුවන් නොමැති බවත්, ගමේ මිනිසුන් එකතු වුවහොත් එය සිදු කිරීමට හැකි බවත් ප්‍රකාශ කළ බවත්, හොරගොඩින් උඩුමත්ත පාසලට යන මාර්ගය, විජේනායක පාසලට පිටිපස්සෙන් යන මාර්ගය, යන මාර්ගවල මාන පදුරු වැවිලා පාරට කැලැව නැමී ඇති බවත්, මේවා සුද්ද කර ගැනීමට මාර්ග කම්කරුවන් නොමැති බැවින් පාසල් ළමුන් හා ජනතාවට අපහසුතාවයන්ට පත් වන බවත්, මේ සඳහා මුදලක් වෙන් කර මේවැනි කාර්යන් ඉටු කර දෙන ලෙසට සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 12.35 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් කළ මන්ත්‍රීවරුන් සඳහා නොමිලේ ආදාහනා කටයුතු සිදු කිරීම සඳහා වූ යෝජනාවට, මන්ත්‍රීවරුන්ගෙන් සුභසාධක සංගමයක් පිහිටුවා, අසරනවූ මන්ත්‍රීවරුන්ට යම් උපකාරයක් අවශ්‍යයි නම් ඒ සඳහා උපකාර කිරීම සුදුසු බවත්, ඒ සඳහා මන්ත්‍රීවරුන්ගේ දිමනාවෙන් යම් මුදලක් වෙන් කර රුපියල් 500.00 ක් හෝ වෙන් කර විශ්‍රාම ගිය මන්ත්‍රීවරුන්ගේ සුභ සාධනය හා සභාවේ සිටින සියලු මන්ත්‍රීවරුන්ගේ සුභ සාධනය සඳහා එය පුද්ගලිකව යෙදවීමට හැකි නම් ඒ තුළින් එතුමාගේ ප්‍රකාශ කළ කාරණාවත් ඉටු වන බවත්, එතුමා එය සද්භාවෙන් කළ යෝජනාවක් බවත්, එම නිසා එවැනි වැඩපිළිවෙලකට සභාවේ කිසිවෙකු විරුද්ධතාවයක් නොමැති නම් එවැනි වැඩපිළිවෙළකට යොමු වීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළ භූමියේ ගාහස්ථ ක්‍රීඩාගාරයක් සැදීම හොඳ බවත්, ඇහැලියගොඩට එළිමහන් රංග පීඨයක් නොමැති බවත්, එම නිසා එහි ක්‍රීඩාවට හානිදායක නොවන ආකාරයට එළිමහන් රංග පීඨයක් එම ස්ථානයේ ස්ථාපිත කිරීමට හැකි නම් එලිමහන් රංග පීඨයක්ද ස්ථාපිත කිරීම සුදුසු බව තමන් යෝජනා කරන බවත්, ක්‍රීඩාව නොකරන අවස්ථාවක එය කුලියට ලබා දී සභාවට ආදායමක් උපයාගත හැකි බවත්, එලිමහන් රංග පීඨයක් ඇහැලියගොඩ කොහෙවත් නොමැති බවත්, ක්‍රීඩාවට බාධාවක් නොවන ආකාරයට මෙවැනි දෙයක් සකසා ගැනීමට හැකිනම් හොඳ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී

බැකෝ යන්ත්‍රයක් ගෙන ඉක්මනට ම කාණු සුද්ද කර ගැනීමට හැකිනම් එය ඉතා ප්‍රයෝජනවත් බවත්,මැණික් පොළ අසලින් ගමන් ගන්නා විට මැණික් වෙලඳ ව්‍යාපාරිකයින් නිතරම කාණු සුද්ද කර දෙන ලෙසට ඉල්ලීම් කරන බවත්, තමන්ගේ ඉල්ලීමට අනුව සුසඝන්ත මහත්මයා හා එක්ව මාර්ගය දෙපස කැලෑව සුද්ද කර දුන් බවත්, විලේගොඩ ප්‍රදේශයේ යටවෙන ප්‍රදේශවල ගාමිණි මහත්මයා යොදවා සුද්ද කළ බවත්, සබාවේ මාර්ග කම්කරුවන් සිටිනම් මේ

කාර්යන් සිදු කර ගත හැකි බවත්, ඉස්සර තම තමන්ගේ නිවෙස් ඉදිරිපිට තම තමන් සුද්ද කර ගත් බවත්, මේවන විට කාර්ය බහුලත්වය හේතුවෙන් මිනිසුන්ට ඒ දේවල් කර ගැනීමට නොහැකි වී ඇත් බවත්, බැකෝ යන්ත්‍රය ඉක්මනින්

ලබා ගැනීමට හැකි නම් නගරයේ කාණු පද්ධතිය සුද්ද කර ජලාප්‍රවාහන පද්ධතියේ පවතින ගැටලු විසඳා ගැනීමට හැකි බවත්, තමා විසින් ඉදිරිපත් කළ යෝජනා හැකිතාක් ඉක්මනට සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින බවත්, ඒ තුළින් ජනතාවට විහාල සේවයක් ඉටු කර ගැනීමට හැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය ප.ව 12.37 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ගරු සභාපතතිතුමනි, මේ දිනවල වර්ෂාව හේතුවෙන් මාර්ගය දෙපස තිබෙන කුඩා මාර්ගවල ජලය ප්‍රධාන මාර්ගයට ගලා ඒම හේතුවෙන් විලේගොඩ සිට බෝපැත්ත දක්වා ගමන් ගැනීමට අපහසු බවත්, ඒ නිසා විලේගොඩ සිට බෝපැත්ත දක්වා කාණු පද්ධතිය සුද්ද කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ අවදානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සංවර්ධන යෝජනා ඉදිරිපත් කරිමේ දී එම යෝජනාව ඉදිරි පත් කර මාස 6 ඉක්මවූ පසු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක් හෝ මන්ත්‍රීවරයෙක් එම යෝජනාව නැවත ඉදිරිපත් කරනවා.දැන් ප්‍රකාශ කරනවා නැවත් සංවර්දන යෝජනා ඉදිරිපත් කරන්න එපා කියලා ප්‍රකාශ කරන බවත්, මේ සිද්ධින් දෙස බලන විට විපක්සයට වක්‍රව පහර ගැසිමක් ද වෙන්නේ යනුවෙන් හැගෙන බවත්, ගමේ සංවර්ධන කටයුතු කරිමට තමන්ද කැමති බවත්, සංවර්ධන යෝජනා ඉදිරිපත් නොකරන ලෙස ප්‍රකාශ කරනවා නම් සියලු දෙනා ම සංවර්යෝජනා ඉදිරිපත් කරන්න එපා යනුවෙන් තීරණයක් ගත යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බෝපැත්ත දිද්ද කොට්ඨාශයට මාසයකට දෙවරක් ආයුර්වේද සායනයක් ලබා දෙන මෙන් මීට ඉහත සබාවාරයකදී තමා ඉල්ලීම් කල බවත්, ඔබතුමාගේ යෝජනව පරිදි 2026.06.17 වන දින බෝපැත්ත ප්‍රදේශයේ ආයුර්වේද සායනයක් පැවැත්වීමට සංවිධානය කර ඇති බව ආයුර්වේද හා පුස්තකාල විෂය භාර සංවර්ධන නිලධාරී සාරංගා මහත්මිය ප්‍රකාශ

කළ බවත්, බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ අසරණ වූ අංශභාග රෝගී තත්ත්වය ඇති, රෝගින් විශාල පිරිසක් සිටින බවත්, එම පිරිස ප්‍රතිකාර සඳහා පුස්සැල්ල ආයුර්වේදයට හා පනාවල ආයුර්වේදයට යා යුත් බවත්, ඒ පිරිසට සහනයක් හා ප්‍රජා සත්කාරයක් විදිහට තමන් විසින් ඒ යෝජනාව සභාවට යොමු කල බවත්, සභාපතිතුමාගේ හා ලේකම්තුමාගේ සද්භාවය නිසා ගත් ඒ ක්‍රියාමාර්ගයට තමාගේ පළමු ස්තුතිය පුදකර සිටින බවත්, දෙනුව ආයුර්වේද හා පුස්තකාල විෂය භාර සංවර්ධන නිලධාරී සාරංගා මහත්මිටත් ස්තුතිය පුදකර සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප.ව 12.39 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ලෝක පරිසර දිනයක් මේ මාසය තුළ දින කිහිපයක් තුළ රාජ්‍ය මට්ටමින් ප්‍රාදේශිය මට්ටමින් ආයතන මට්ටමින් සමරපු කාල පරිච්ඡේදයක් බවත්, ඒ තුළ බෙරුවාන කසල අංගනයට ලොකු ගැටලුවක් වී ඇති බවත්, එයියට බැහැර කරන අපද්‍රව්‍ය වර්ෂාවත් සමඟ ජලයට මුසුවීමත් නිසා අවට ගම්මාන කීපයකට ම විශාල පරිසර ගැටලුවක් වී ඇති බවත්, එම අපද්‍රව්‍ය වර්ෂාවත් සමඟ ජලයට මුසු වීමත් සමඟ අවට දුගඳ හමන බවත්, මහ වෙල ඇළ මීට අවුරුදු දෙකකට තුනකට කලින් මිනිසුන් නාන්න භාවිතා කරපු ඇළක් බවත්, මේ පරිසරයට මුසු වන අපද්‍රව්‍ය හේතුවෙන් අද වන විට ඒ ඇළ අසලින් ළඟි ගමන් බිමන්වත් යෑමට නොහැකි තත්ත්වයක් ඇති වී ඇති බවත්, ඒ පිළිබඳව විද්‍යාත්මක පරීක්ෂණයකට ලක් කර , ජලය සමඟ පරිසරයට මුසු වන අපද්‍රව්‍ය, පරිසරයට මුදා හැරීම වලක්වන ලෙසට ප්‍රවේශයක් ගැනීමට කටයුතු කරන ලෙසට පළමුව යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය ප.ව 12.40 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ප්‍රාදේශිය සභාවේ ආදායම් උත්පාදනය කරන මාර්ගයක් ලෙස පොළ භූමිය බාවිතා කරයි කියා බලා පොරොත්තු වන බවත්, බස් රථ හා රථවාහන ගාල් කරන ස්ථානයක් ලෙස දැනටත් භාවිතා කරන බවත්, පොළ භූමිය පොල සඳහා ද භාවිතා වන බවත්, එහි තිබෙන විශාල මාර ගසෙන් කොටසක් මේවන විට දිරාපත් වී ඇති බවත්, එය ඉවත් නොකළ හොත් ඉදිරියේ දී විශාල ගැටලුවකට මුහුණ දීමට සිදු වන බවත්, ජීවත හානියක් එහෙම සිදු වුවහොත් එය ප්‍රාදේශිය සභාවට ගැටලුවක් බවත්, ස්ථානීය පරීක්ෂණයක් සිදු කර එම ගස පිළිබඳ විශේෂ අවධානය යොමු කරන් ලෙසට දැන් වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මීට අවස්ථා කීපයක දීම ප්‍රකාශ කළ පරිදි පොළ භූමිය අවට තිබෙන බැම්ම තැන් කීපයක දීම පුපුරා කඩා වැටීමට ආසන්නව තිබෙන බවත්, මේ සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති බවට මින් පෙර අදහස් ප්‍රකාශ කිරීමක දී තමාට දැන ගන්න ලැබුණු බවත්, එසේ ප්‍රතිපාදන වෙන් වී තිබෙනවා නම් හැකි ඉක්මනින් ඒ බැම්ම පිළිබඳ අවදානය යොමු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප.ව 12.42 ට නැවත සභාවට පැමිණෙන ලදී.

තමන් ඉරිදා දින පොළ භූමියට ගිය බවත්, ඒ අවස්ථාවේ ප්‍රාදේශිය සභා නිලධාරීන් කසල එක් රැස් කිරීමේ කටයුතුවල නිරත වී සිටි බවත්, පොලේ වෙළඳුන් සමඟ සාකච්ඡා කර පොළෙන් එකතු වන කසල ජලයට මුසු නොවන ආකාරයට එක් රැස් කිරීමට හැකි නම් සුදුසු බවත්. අපද්‍රව්‍ය ජලයත් සමඟ මුසු වීම නිසා එම අපද්‍රව්‍ය එකතු කිරීමේ දී සේවකයන්ට ගැටලුවලට මුහුණ දීමට සිදු වන බවත්, එම නිසා පොළේ වෙලඳුන් සමඟ සාකච්චා කර ජලයට මුසු නොවන ආකාරයට ක්‍රමානුකූලව බැහැර කරන ක්‍රමවේදයක් සකස් කිරීමට හැකිනම් එය සුදුසු බවත්, ඒ වගේ ම වෙළෙන්දන්ගේ හා අපේ

සභාවේ සේවකයින්ගේ අවධානය යොමු කල යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

දෙනිකව පොළේ කසල එකතු කිරීමේ කටයුතු සිදු කරන බවත්, අඩු පාඩු පෙන්වා දෙන අතරම හොඳ දේවල් අගේ කරන බවත්, යකඩ රාමු නොමැති ගලි වලවල් කීපයක් තිබෙන බවත්, මේ සම්බන්ධව මීන් පෙර ද ප්‍රකාශ කළ බවත්, ඒවා මේ වන විට ආවර්ණ යොදා වසා ඇති බවත්, විශාල සංවර්ධන කටයුතු කීපයකට ම පොළ භූමිය යොදා ගැනීමට සැලසුම් කර ඇති බැවින් එම ගලිවලවල් ආවරණ කිරීම් ක්‍රමවත් විය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ ජාතික පාසල සම්බන්ධ ලිපියක් ගියවර සභාවට හදිසි යෝජනාවක් ලෙස ඉදිරිපත් කළත්, මේ වන විට ඒ සම්බන්ධව නිෂ්චිත පිළිතුරක් ලැබී නොමැති බවත්, ඒ සඳහා තමන් පිලිතුරක් අපේක්ෂාවෙන් පසු වන බවත්, ඒ සඳහා විශේෂ අවධානය යොමු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප.ව 12.44 ට නැවත සභාවට පැමිණෙන ලදී.

පුස්තකාල උපදේශක කමිටුව සම්බන්ධව මීට පෙර අදහස් ප්‍රකාශ කළ බවත්, පුස්තකාල උපදේශක කමිටුවේ පුස්තකාල පාඨක සමාජ සභාපතිවත් නොමැති බවත්, සංස්කෘතික බල මණ්ඩලයේ සභාපති සුමිත් මන්ත්‍රිතුමා බවත්, එතුමාත් ඇතුළත් වී නොමැති බවත්, මෙම පුස්තකාල උපදේශන කමිටුවට තව සාමාජිකයින් ඇතුළත් කිරීමට හැකි නම් සුමිත් මන්ත්‍රිතුමා ද ඒහි සාමාජිකත්වය සඳහා ඇත්ළත් කරන ලෙසත්, පාඨක සමාජයේ සභාපති හිදුරංගල ප්‍රදේශයේ බවත් එතුමා ඇතුළත් වී නොමැති බවත්, ඊට අමතරව පාසල් ආදී ශිෂ්‍ය සංගමයේ සභාපතිවරුන්ට ද මේ පුස්තකාල උපදේශක කමිටුව නියෝජනය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය ප්‍රකාශ කළ පරිදි අක්කර 3 ප්‍රදේශය සුලු ගංවතුරට පවා ඒ අවට නිවෙස් ගංවතුරට යට වන බවත්, කුමන හෝ ආයතනයකින් හෝ පරිසර අමාත්‍යාංශය මැදිහත් වීමකින් හෝ ප්‍රතිපාදන ලබා ගෙන ඒ කාණු පද්ධතිය ක්‍රමවත් කිරීම සඳහා විශේෂ අවදානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ප.ව 12.46 ට සභා ගර්භයෙන් පිට විය.

මෝරගල පාර කැඩි තිබෙන තැන මාන පඳුරු නිසා පාර පෙනෙන්නේ නැති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය මේ පිළිබඳව අවස්ථා කීපයකදී ම අදහස් දැක් වූ බවත්, ලේකම්තුමාට මේ පිළිබඳව දැනුවත් කර ඇති බවත්, ඒ පිළිබඳව විශේෂ අවදානය යොමු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ප.ව 12.48 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය.

ගරු සභාපතිතුමනි, මිටිඩපාල වසමේ වසමේ තරුන කණ්ඩායමක් එකතු වී පිරිසිදු කිරීමේ වැඩසටහනක් කළ බවත්. ඒ වැඩසටහන මඟින් කිරිපොරුව මිටිපොල ප්‍රධාන මාර්ගයේ කසල බඳුන් තැන් තැන්වල ස්ථාපිත කළ බවත්, සති දෙකකට වතාවක් වත් එම එම කසල බඳන් අස් කර ගැනීම සඳහා ට්‍රැක්ටරයක් සමඟ දිනයක් ලබා දෙන ලෙසට සභාපතිතුමාට ඉල්ලීමක් කරන ලෙසට ප්‍රකාශ කළ බවත්, පොලිතින් වැඩිපුර ප්‍රමාණයක් කසල බඳුන්වල එක්රැස් වී ඇති බවත්, මේවන විට ඒ කසල බඳුන් පිරී ඉවත් කරන මට්ටමට පත් වී ඇති බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කර

කටයුතු කරන ලෙසට යෝජනා කරන් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය ආණ්ඩු සඳමයෙත් පෙරපාසල් විෂය සභාව තුල තිබු බවත්, පෙරපාසල් කිහිපයක් සබාව මඟින් නඩත්තු කිරීම් කළ බවත්, පෙරපාසල් සඳහා ප්‍රතිපාදන ලබා දුන් බවත්, පෙර පාසල් ගුරුවරු සඳහා දැනුවත් කිරීම් කල බවත්, පෙර පාසල් සම්බන්ධ නිලධාරී තුමිය සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත්, දැන් පෙර පාසල් සම්බන්ධව වචනයක්වත් සභාව තුළවත්, පවතින ආණ්ඩුව තුළවත් කතා නොවන බවත්, අයවැය වාර්තාවේ පෙර පාසල් සඳහා කිසියම් මුදලක් වෙන් කර නොතිබු බවත්, පෙරපාසල් විෂය ඉවත් කර ඇති බව විෂය නිලධාරිතුමිය ප්‍රකාශ කළ බවත්, නැවත එම විෂය සබාවට ඇතුළත් කරන ලෙසට තමා යෝජනා කරන බවත්, පෙරපාසල්වල සනීපාරක්ෂක පහසුකම්, පිරිසිදු කිරීමේ උපකර්ණ ලබා දීම , සෙල්ලම් උපකර්ණ ලබා දී ම ආදි සියල්ලක් කලින් කළ බවත්, මේවන විට පෙරපාසල් සම්බන්ධ කිසිම දෙයක් සබාව තුළ කතා නොවන බවත්, පෙරපාසල් විෂය සඳහා යෝජනාවක් ගෙනවිත් නැවත ඇතුළත් කර පෙරපාසල් සඳහා කිසියම් මුදලක් පෙර පාසල් සඳහා ලබා දීමට කටයුතු කරන ලෙස යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

පෙර පාසල් ප්‍රාදේශිය සභාවට අයත් නොවෙන බවත්, පෙරපාසල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් බවත්, ආණ්ඩුවෙන් මේවන විට පෙර පාසල් ගුරුවරුන්ට දිමනාවක් ගෙවන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ පෙරපාසල සඳහා තමාගේ මැදිහත් වීමෙන් සෙල්ලම් මිදුලක් ලබා දුන් බවත්, මන්ත්‍රිතුමියගේ කොට්ඨාශයේ පෙර පාසල් සඳහා (සෝෂාව) පෙරපාසල් පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් බවත්, රජය සහ කිසිම දේකින් පෙර පාසල් සඳහා ප්‍රතිපාදන ලබා නොදෙන බව මන්ත්‍රිතුමිය ප්‍රකාශ කළ බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය.

පෙර ආණ්ඩුව මඟින් පෙරපාසල් ගුරුවරු 6 දෙනෙකුට දිමනාවක් ගෙවූ බවත්, ප්‍රාදේශිය සභා ගුරුවරු ලෙස සිටි බවත්, තමනුත් ඒ කාලෙස් පෙර පාසල් ගුරුවරියක් ලෙස සේවය කළ බවත්, ඒ සඳහා දැන් මොකද වුණේ යනුවෙන් තමන් විසින් විමසීම් කල බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

සබාව මඟින් කිසිම පෙර පාසලක් ක්‍රියාත්මක නොවන බවත්, එම නිසා ප්‍රතිපාදන ලබාදීමට නොහැකි බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙතැන් සිට සභා මුලාසනය ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා වෙත භාර දෙන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා දැනුම් දී සභා මුලාසනය ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා වෙත භාර දෙන ලදී.

ප.ව 12.52 සිට සභා මුලානය ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මෙහෙයවන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, විදුලි පහන්අලුත් වැඩියාව සඳහා විදුලි උපකර්ණ මිලදි ගැනීමට මුදල් කාරක සභාවෙන් යෝජනා සම්මත වී ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ පරිදි තමන්ගේ

කොට්ඨාශවලට අයත් මාර්ගවල විදුලිබල්බ පිච්චිලා ඇති බවත්, විදුලි පහන් ටිකක් හම්බෙලා ඇති බවත්, එකට දෙකක් දෙන බවත්, එක ලොට් එකකට මුදල් ගෙවූ විට තව ලොට් එකක් නොමිලේ ලබා දෙන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කළ බවත්, නමුත් එහි ගුණාත්මකභාවය පිළිබඳ ගැටලුවක් ඇති බවත්, වොරන්ටි තිබුණත් නැවත ලයිට් කණුවට නැග ඒවා ගලවලා, ඒ ආදාළ ආයතනයට භාර දී මාරු කර ගෙනවිත් නැවත සවි කිරීමට යන කාලය වෙන විට නව ආණ්ඩුවක් පිහිටවන බවත්, මෙවර ආයතන ගොඩක් යෝජනා වී තිබෙන

බවත්. විශේෂඥභාවයක් නොමැති නම් විශේෂඥ ඥානය තිබෙන පුද්ගලයෙකු යොදවා, යම් පිරිවැයක් වැඩි නම් පිරිවැයක් යොදවා හෝ ගුණාත්මකභාවයෙන් යුතු හොඳ විදුලි උපකර්ණ හා විදුලි බල්බ මිලදී ගැනීමට කටයුතු කරන ලෙසත්, තමා ඒ සඳහා සභාවේ අවධානය යොමු කරන බවත්, තමන්ගේ ආණ්ඩු කාලයේදීත් ඒ නරක අත්දැකීම තිබූ බවත්, මේ කාලයේ හරි එය නිවරදි වුණොත් හොඳයි යනුවෙන් සිතන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

රේල් පාරේ කසල දැමීම සම්බන්ධව ගියවර සභාවේ දී අදහස් දැක්වූ බවත්, ඒම කසල ඉවත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත්,ඒ සම්බන්දව සන්තෝෂ වන බවත්, මේ අපද්‍රව්‍ය කළමණාකරණයට ආණ්ඩුව විසින් ප්‍රාදේශිය සභා මැතිවරණයට පෙර කසල කළමණාකරනයට තිරසාර විසඳුමක් තිබෙන බව ඉදිරිපත් කර තිබූ බවත්, නමුත් තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණයක් මේ ඇහැලියගොඩ නගරයේ සිදුවන බවක් දක්නට නොලැබෙන බවත්, එස් සිදුවනවා නම් මේසේ තැනින් තැන කසල නොදමන බවත්, දැන් ආණ්ඩුව බලයට පැමිණ අවුරුද්දක් ගෙවී ඇති බවත්, ඒම තිරසාර කසල කලමණාකරණ වැඩසටහන ක්‍රියාත්මක කර මෙහි ප්‍රතිලාබ ලබන්න කාලය හරි බවත්, නමුත් එහි ප්‍රතිඵල දකින්න නොමැති බවත්, මෙය ජනතාවගේ චෝදනාවක් බවත්, නැවත නැවත කසල ජනනය වන ස්ථාන හදුනාගෙන ඒ සඳහා ස්ථීර විසඳුමක් දිය යුතු බවත්, ඒ සඳහා තමන්ට විසඳුම් තිබෙන බවත්, ඒ සඳහා වැඩකටයුතු කිරීමට ජනතාව ඔබලාට බලය ලබා දුන් බවත්, ඒ සඳහා අවධානය යොමු කර කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගොවිජන සේවා කාර්යාලයෙන් ට්‍රැක්ටර් දෙකක් ලබා දෙන බවට ගියවර සභාවේ ලොකුවට තර්ක කල බවත්, සභාවෙදී මේ ගැන විමසීමක් නොකර සම්බන්ධීකරණ කමිටුවේදී අපි භාර ගන්නවා යනුවෙන් අදහස් ප්‍රකාශ කළ බවත්, ඒ සඳහා සභාවේ බලතල නොමැති බව තමන් විස්න් ඒ අවස්ථාවේ පෞද්ගලිකවත් දැනුම් දුන් බවත්, දිගින් දිගටම මේ සම්බන්ධව තර්ක කලත් දැන් අවසානයේ ට්‍රැක්ටර් දෙක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ම ලබා දුන් බව වාර්තාවේ තිබෙන බවත්, එය අද දිනයේ දැක්ක බවත්, එය හොඳ දෙයක් බවත්, අනවශ්‍ය ප්‍රශ්නවලට මැදිහත් නොවිය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෝරගල හන්දියේ ප්‍රශ්න කිපයක් තිබෙන බවත්, මෝරගල හන්දියේ විදුලි පහන් දෙක ම අක්‍රිය බවත්, අධික කරුවල නිසා නොයෙකුත් අයථා කටයුතු වන බවට විවිධ ආරංචි එන බවත්, කාන්තාවන්ට රෑට ගමන් බිමන් යද්දි ප්‍රශ්න වෙලා තිබෙන බවත්, මේ තත්ත්වය නිසා තව තව ප්‍රශ්න වැඩි විමට ඉඩ තිබෙන බවත්, මේ නිසා මේ සම්බන්දව විදුලිබල මණ්ඩලය දැනුවත් කර, මේ සම්බන්ධව පහසුකම් ඇහැලියගොඩ නොමැති බවත්, නමුත් රත්නපුර මේ සම්බන්දව පහසුකම් තිබෙන බවත්, මේ සම්බන්දව ක්‍රියාත්මක වී හන්දියේ තිබෙන විදුලි පහන් දෙකවත් නවීකරනය කරිමට කටයුතු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ලොරියක් අනතුරට පත්වූ කඩකාමරයක් මෝරගල හන්දියේ තිබෙන බවත්, මෙය උසාවියේ නඩු කටයුත්තක් සිදුවන දෙයක් බවත්, දැන් මෙ සඳහා මාස තුන හතරක් ගතවී ඇති බවත්, එහි ඇති ලී හා තහඩු තාම පාරෙන් ඉවත් කර නොමැති නිසා පදික වේදිකාවේ එහා මෙහා ගමන් ගන්නා විට මහජන පීඩාවක් ඇතිවන බවත්, මහජන පිඩා යටතේ හෝ ප්‍රාදේශිය සභාවක් විදිහට ඒ සඳහා මැදිහත් වීමක් සිදු කිරීමට හැකි නම්, පදික වේදිකාවේ මහජනතාවට සුරක්සිත ආකාරයට ගමන් ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කිරිමට හැකි නම් ඒ කටයුත්ත සිදු කර දෙන ලෙසත්, මෙය ජනතාවගේ ඉල්ලිමක් බවත්, මෙය මිනිසුන්ගේ ඇගට කඩා වැටී අනතුරක් වීමට ඉඩ ඇති බවත්, සභාව මැදිහත් වී උසාවියේ අවසර ගෙන එය ඉවත් කිරිමට හැකි නම් එය ඉවත් කිරිමට කටයුත් කරන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෝරගල හන්දියේ සිට මීටර් 50 හි මීටර් 100 අතර කොටසක මන පදුරු වැවී ඇති බවත්, ඒ තුලින් අනතුරක් සිදු විමට ඉඩකඩ වැඩි බවත්, ප්‍රධාන පැතිබැම්ම ඇළට වැටී ඇති බවත්, ඊයේ දිනයේද ත්‍රී රෝද රථයක් ඇළට පෙරලී අනතුරක් සිදු වී ඇති බවත්, ප්‍රෙද්ශයේ මන්ත්‍රීවරයෙක් ලෙස පළාත් සභාවෙන් ඉල්ලිමක් කළ බවත්, ඔවුන් ඉල්ලීම පිළිගත් බවත්, නමුත් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොමැති බවත්, ඔබතුමන්ලා මාර්තු 31 හදනවා කිවූ කාපට් පාර දැන් දෙසැම්බර් 31

හදන්න ඉන්න කාපට් පාරට කැඩී ඇති පැති බැමි ටික යථාවත් කරන ආකාරයට යෝජනාවක් එකතු කිරීමක් කරන ලෙසටත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉන්ධන ප්‍රශ්නය නිසා පාසල් ළමුන්ට හා ගුරුවරුන්ට පාසල් යෑමට හා වෘත්තිකයින්ට රැකියාවට යෑමට නොහැකි වී ඇති බවත්, ස්ථාවර වැටුපක් ලබන පුද්ගලයින් මේ ඉන්දන මිල වැඩි වීම නිසා එදිනෙදා රාජකාරිය සඳහා ගමන් ගන්නේ වාහනවලින් නම් ඒක ලොකු ගැටලුවක් බවට පත් වී ඇති බවත්, මේ සඳහා රටක් හා ප්‍රදේශයක් විදිහට දීර්ඝ කාලීන විසඳුමකට යායුතු බවත්, මීට පෙර සබාවක තමන් QR coad එකට යායුතු යැයි ප්‍රකාශ කළ විට, නෑ නෑ ඇති තරම් ඉන්ධන තිබෙන බව ප්‍රකාශ කළ බවත්, උද්දච්චකමට ලොකුකමට සිටින් නැතුව ජනතාව විදිහට යම් සැලැස්මකට

පැමිණිය යුතු බවත්, ඉදිරි මාස කිපය ඉන්ධන සම්බන්ධව විශාල අර්බුදයක් පැමිණෙන බවත්, ඒ අර්බුදයේ ප්‍රතිලාභ මේ ප්‍රදේශයේ ජීවත්වන ජනතාව විදහට අනාගතයේ බුක්ති විඳීමට තිබෙන ඉඩකඩ වැඩි බවත්, ඉදිරියේදී යුරෝපයේ සීත සෘතුව පැමිණෙන බවත්, එවිට ඒ රටවලට ඉන්ධන වැඩි වශයෙන් ඉල්ලුම වැඩි වන බවත්, සැජ්තැම්බර් වල සහනාධාර කපන ලෙසට මූල්‍ය අරමුදල ප්‍රකාශ කර ඇති බවත්, එවිට තව රුපියල් 100.00 කින් පමණ ඉන්ධන වැඩි වීමට ඉඩකඩ තිබෙන බවත්, අරපිරිමැස්සෙන් ඉන්ධන පරිභරණය කිරීම පිළිබඳව මේ මොහොතේ ජනතාව දැනුවත් කළ යුත් බවත්, QR coad එක නැවත ගෙන එන ලෙසට රජයත් උනන්දු කළ යුතු බවත්, අර්බුදයක් තුළින් ජයග්‍රහනය කිරීමට තමන්ට අවශ්‍ය නැති බවත්, ජනතාව විදිහට එකතු වී මේ ප්‍රශ්නයට මුහුණ දීමට සුදානම් බවත්, මේ සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය ප්‍රකාශ කළ ආකාරයට මේ සභාවෙන් පෙර පාසල් 3 කට දීමනාවල් සහ ගෙවීම් සිදු කරනු ලැබූ බවත්, පහළගම සුදෙව් පෙර පාසලත්, බුළුගහපිටිය

රන්තරු පෙර පාසලත්, දිවුරුම්පිටියේ පෙර පාසලකුත් යන පෙර පාසල් තුනකට පෙරපාසල් පාලිකාවන් සඳහා දීමනාවක් තමනගේ මතකයේ හැටියට ලබා දී තිබූ බවත්, ඒ සම්බන්ධව ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කර එය කෙසේ සිදු වුවාද යන්න සොයා බලන ලෙසටත්, එසේ වුවා නම් එය ඉදිරියටත් ක්‍රියාත්මක කරනවා ද යන්නත්, ගැටහැත්තේ බහුකාර්ය ගොඩනැගිල්ල මෙන් ගැටලු තත්ත්වයක් තිබේද යන්න සොයා බලන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමා මේ සභාවට උදැසන කළ යෝජනාව ඉතාම සද්භාවයෙන් කළ යෝජනාවක් බවත්, වරප්‍රසාද වරදාන අපට ගැනීමට නොවන බවත්, පෙර දිනක දී කරන ලද පිරිත් පිංකම දිනයේදී කරඩු වහන්සේ පහ්ලට වඩම්මන විට කෑමටවත් නොසිට තමන් ආපසු ගිය බවත්, තමන් දහම්පාසල් ගුරුවරයෙක් බවත්, පාලි හා අභිධර්මය විෂය පිළිබඳව අවුරුදු 10 ක කාලයක සිට දහම්පාසලේ 10-11 අවසාන ශ්‍රේණි හා ධර්මාචාර්ය විභාගය සඳහා උගන්වමින් සිටින ගුරුවරයෙක් වශයෙන් තමන් විඳානයෙන් සිටින බවත්, මඩ ගැසීමට නොයන බවත්, අස්ගගුලෙ කාණු පද්ධතියක් යොදා පාර සෑදීම සම්බන්ධව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාට ස්තුතිය පුද කරන බවත්, අතන කැඩෙන්න ගිය දැන් එතන දාල තියෙනවා.බෝර්ඩ් දෙකක් ගහලා තියෙනවා. එක බෝර්ඩ් එකක තියෙනවා පෙළබුයේ කියලා. අනෙක් බෝර්ඩ් එකේ තියෙනවා ග්‍රාමසේවා වසම අස්ගගුල දකුණ කියලා.තමන් ඒ අවස්ථාවේ ම සභාපතිතුමාට කතා කළ බවත්, මේ දෙක ගලවන්න කිවූ බවත්, ඕක අපි කළා නම් facebook එකේ යනවා.ඔබතුමාලගේ භාෂාවෙන් කියනවා නම් අපිව පට්ට යවනවා.පට්ට විදිහට ගහනවා.නමුත් එය අපි විසින් නොකල බවත්, තමන් මුන්සීර් මන්ත්‍රීතුමත් සමඟත් මේ ගැන කතා කළ බවත්, එය නිවරදි කරන්න ඕන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා කිවූ බවත්, නමුත් අපි ඒ සඳහා මඩ නොගසන බවත්, ඒවා තේරුම් කර දෙන බවත්, පුස්තකාල සඳහා කමිටුවක් පත් කල බවත්, අපේ කවුරුවත් ඒ සඳහා පත් කර නොමැති බවත්, යම්කිසි විදිහකින් මෙවැනි දේ සිදු කර ඔබතුමන්ලා ගන්න තීරණ, බලප්‍රදේශය පිළිබඳ අවබෝධයක් නොමැති අය මේ කමිටුවේ සිටින බවත්,අවශ්‍ය නම් නමින් ප්‍රකාශ කළ හැකි බවත්, ඒ නිසා යම් තීරණයක් ගෙන යම් ගැටලුවක් ඇති වුවහොත් අපිට අධිකරනයේ දී ප්‍රකාහ කරන්න බෑ අපි දන්නෑ ස්වාමිනි කියලා බවත්, ඇයි අපි සභාවේ හිටියා.අපි මහජන නියෝජිතයෝ.ඒ නිසා අපිව පත් කර ගන්න ඕනෙත් නෑ.මොකද ඔබතුමාලට ස්වාධිනව ඒ කටයුතු කරගෙන යෑමට ඔබතුමාලා ගත් තීරණයට අපේ විරෝධතාවයක් නොමැති බවත්, නමුත් යම්කිසි විදිහකින් නිතිමය ගැටලුවක් ආපු තැනකදී අපි විපක්ෂයේ කණ්ඩායමක් හැටියට අපිව ඇතුළත් කර ගන්න එපා කියන එක ඉතාමත් ගෞරවනීයව ඔබතුමාට සිහිපත් කරන බවත්, මේවා පිළිබඳව ඉතාම අවබෝදයෙන් යුතුව කටයුතු කරන බවත්, , ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තව මන්ත්‍රී කෙනෙක් ප්‍රකාශ කලා ඔබතුමාලා වරප්‍රසාද ගන්න මෙතනට ඇවිල්ලා තියෙන්නේ කියලා.මේ වෙන කොට මට වයස 52 යි.අවුරුදු 38 ක් තිස්සේ ගම් 8 ක මළ ගෙවල් සිදු වූ විට ඒවා සංවිධානය කර ඒක පිළිගැනීම් කරලා ස්තුති කරලා වැඩසටහන් කරලා තියෙනවා 354 ක්.අෂ්ඨක කියලා තියෙනවා 128 ක්. කිසිම කෙනෙක්ගෙන් කිසිම ගෙදරකින් ශත පහක් අරන් නෑ.අපේ වියදමින් අපි සමාජ සේවා කරපු මිනිස්සු අපි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප.ව 1.07 ට නැවත සභාවට පැමිණෙන ලදී.

එ නිසා අපිට කිවුව කාරණාවලට දුකයි.අපි මෙතනට ඇවිත් තියෙන්නේ අපිට වරප්‍රසාද ගන්න නෙමෙයි.අදත් දෙන්න ඕන ඇහැකට කාවයක් දාපු නැන්දා කෙනෙකුට මුදල්.අපි ඒවා ප්‍රසිද්ධ කරන්නෑ.අපි අපේ ළමයෙකුට ටොෆියක් ගිහින් දෙන්නෑ මේ සල්ලිවලින්.අපි එහෙම කෙලින් දේශපාලනය කළ නිසා අපි යම්කිසි යෝජනාවක් ඉදිරියේ දී ගේන්නෙත්, ඉදිරියේදී වැරදි පෙන්වා දෙන්නෙත්, මේ සභාව ඉදිරි ගමට ගෙනියනින ඕන නිසා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ නගරය නිරන්තරව ගංවතුරට යට වෙන බවත්, පොලීසිය තිබෙන ස්ථානය නිරන්තරයෙන් යට වෙන බවත්, දෙපැත්තේ ක්‍රමවත් කාණුවක් සකසා ක්‍රමවේදයක් සැකසිය යුතු බවත්, පොඩි වැස්සක් වැස්සත් යට වෙන බවත්, මිනිසුන්ට ගමන් කිරීමටත් අපහසු බවත්, ඇළ පද්ධතිය පළල් කළහොත් වතුර බැස යන බවත්, වතුර බැසීමට එක ඇළක් පමණක් තිබෙන බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

උතුරේ LTTE යුද්ධය අවසන් වී වසර 17 පිරෙන මොහොතේ උතුරේ සහ කොළඹ වැල්ලවත්තේ කොටි සැමරුමක් සැමරූ බවත්, ජාතියක් වශයෙන් පාට පක්ෂ භේදයකින් තොරව තමා මේ අදහස් ප්‍රකාශ කරන බවත්,ඇත්තට ම මේ සම්බන්ධව කණගාටුවන බවත්, මේ අවුරුදු 17 ක් තුළ කොළඹට කොටි කියන සංවිධානය නොපැමිණි බවත්, නමුත් මේ ආණ්ඩුව තුළ කොටි කියන සංකල්පය කොළඹට ආව බවත්, අපි මේ සම්බන්ධව ජාතියක් වශයෙන් ලැජ්ජ විය යුතු බවත්, රණවිරුවෝ මේ රට දැය බේරගෙන මේක රැක ගත්ත රටක් බවත්, සලේටත් ඔබතුමන්ලා ගොකු අසාධාරණයක් කර ඇති බවත්, සලේලා ඉන්න ඕනේ එළියේ බවත්, එළියේ ඉන්න ඔන මිනිස්සුන්ව ඇතුළට දාලා, ඇතුළේ ඉන්න ඕන මිනිස්සුන්ව එළියට දාලා තිබෙන බවත්, (සෝෂාව) දැන් CID එකේ ඉන්න ශානිලා එහෙම කොහෙද ඉන්න ඕනෙ කියලා බලන ලෙසත්, ජාතියක් බේරගත්ත රණවිරුවෝ ඇතුළේ ඉන්න බවත්, ඇතුළේ ඉන්න ඕන අය එළියේ ඉන්න බවත්, කොටි සැමරුම් නැවත කොළඹ නොඅපවත්වන ලෙසට ආණ්ඩුව දැනුවත් කරන ලෙසත්, කොටි සැමරුම් පැවැත්වීමට අවශ්‍ය නම් පැලවත්තේ පවත්වන ලෙසත්, අන්න එදාට තමන්ද උදව් කරන බවත්, මේක අපේ රට බවත්, ඔබතුමන්දා අද ආණ්ඩු පක්ෂයේ සිට හෙට යන්න පුළුවන් බවත්, මේ රට අනාගත දරු පරපුරට අවශ්‍ය බවත්, සිංහල බෞද්ධ කියන හා දෙමළ මුස්ලිම්, මොකද මේක දෙමළ මිනිස්සුන්ට ඇවිල්ලා යන්න පුළුවන්. එක සිංහල මනුස්සයෙක් දෙමළ මනුස්සයෙකුට ගහනවද කියලා බලන්න බවත්, ගහන් නැති බවත්, හැබැයි සිංහල මනුස්සයෙකුට යාපනයේ යන්න බැරි බවත්, සිංහල මනුස්සයෙක් යාපනයේ ගිය විට ඒ මනුස්සයාට ගහන බවත්, මොකක් ද මේ ප්‍රජාතන්ත්‍රවාදී කියන රට යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විමසන ලදී.මේක සුළුවට හිතන්න එපා බවත්, මේක අපේ රට බවත්, මේක පාට පක්ෂ දේශපාලනය වෙනස් බවත්, මේ ක්‍රියාව සම්බන්ධව අපි දුක් විය යුතු බවත්. රාජ්‍ය අනුග්‍රහය ඇතුව කොළඹට පැමිණ, පොලිසියෙන් ආරක්ෂාව දුන් බවත්, ඊට විරුද්ධව ඉන්න අයට පොලිසියෙන් ගහන බවත්, වෛරය වපුරන්න නාගදීපයේ යන්න කියලා අපේ ජනාධිපතිතුමත් කියූ බවත්, සාමය වපුරන්ද ඒ අය කොළඹට ආවේ යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විමසන ලදී. LTTE යෙ කොඩිය වනලා මෙහෙ සමරන බවත්, එහෙම වෙන්න දෙන්න එපා, සෙම් රට ගැන අපිට කැක්කුමක් තිබෙන බවත්, අපේ රට ජාතිය කියන හැගීමක් තිබෙන බවත්, මීන් ඉස්සරහට මොන ආණ්ඩුවව තිබුණත් කුමන ආකාරයේ බලය තිබුණත් මීන් ඉදිරියට මෙවැනි දේ සිදු වීමට ඉඩ නොදිය යුත් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා.

ගරු සභාපතිතුමනි, අයාලයේ යන ගවයින් සම්බන්ධව තමන් මෑතක දී සභාපතිතුමා සමඟ සාකච්ඡා කළ බවත්, මීට ඉහත සභාවාරයකත් මේ අයාලයේ යන ගවයින් සම්බන්ධව සාකච්ඡා වූ බවත්, වැවිල කීනගහවිල නුගදණ්ඩ යන ප්‍රදේශවල ජනතාවට මේ අයාලේ යන ගවයින් ප්‍රශ්නයක් වී ඇති බවත්, ආනන්දාරාම පන්සලටත් මෙය ප්‍රශ්නයක් වී ඇති බවත්, මහජන පීඩාව යටතේ මේ සම්බන්ධව කටයුතු කිරීමට ප්‍රාදේශිය සභාවට බලයක් තිබෙන බවත්, මේ සඳම්බන්ධව ඉක්මනින් ම මැදිහත් වීමක් කරන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප.ව 1.13 ට සභා ගර්භයෙන් පිට විය.

කොටි සැමරීමක් සම්බන්ධව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා අදහසක් ප්‍රකාශ කළ බවත්, සභාවේ කටයුතු කරන විට නීතිමය ප්‍රශ්න තිබෙනවා සේ, අපේ ආණ්ඩුවේ ජාතිවාද හා ආගම්වාදය පිළිබඳව කිසිවෙක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකරන වායැයි තමා සිතන බවත්, සැමරුමක් කරන විට නීතිමය පිළිසරණක් තිබිය යුතු බවත්, ප්‍රදර්ශනාත්මකව සිදු කරනවා නම්, අපට පුළුවන් නීතියට යන්න බවත්, උතුරේ අයටත් තමන්ගේ ඥාතීන් සමරන්න පුලුවන් බවත්, (සෝෂාව) සිංහල දෙමළ මුස්ලිම් ඕනම කෙනෙකුට තමන්ගේ ඥාතින් සමරන්න පුලුවන් බවත්, ඒ අයිතිය නැති කරන්න බැරි බවත්, ආගම හා ජාතිය මුල් කරගෙන බලපෑම් කරන්න බැරි බවත්, අනිවාර්යෙන් ඒ සම්බන්දව නීතිය ගදට ම ක්‍රියාත්මක වන බවත්, කවුරුන් හෝ LTTE ය සම්බන්ධ කොඩි හෝ ඡායා රූප හෝ දර්ශනය කරමින් කටයුතු කරනවා නම් ඒ අයට බේරෙන්න පුලුවන් කියලා තමන් නොසිතන බවත්, ඒ නිසා මේ සම්බන්දව සභාවේදී ප්‍රකාශ සිදු කිරීම වැරදි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, රණවිරුවෝ සමරන්න ඕන තැනක පුළුවන් කිවු බවත්, එදා විමල් වීරවංශ මන්ත්‍රිතුමාට (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා ප.ව 1.15 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේ නිර්නාමික ලිපි සභාවට ඒම සෙල්ලමක් වන බවත්, මේ දේ වෙන්න දෙන්න බැරි බවත්, මේ සම්බන්ධව සභාපතිතුමා කුමක් හෝ තීරණයක් ගත යුතු බවත්, නැත්නම් මේ සභාව අපකීර්තියට පත් වන බවත්, මේ සම්බන්ධව ක්‍රියාත්මක වන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා ප.ව 1.16 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපතිතුමනි, මිටිපොල කොට්ඨාශයේ අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවට යොමු කළ බවත්, සම්බන්ධිකරනයට යොමු කර මාස දෙකක් පමන වන බවත්, දැන් එය අවදානම් තත්ත්වය වැඩි බවක් තිබෙනවා කියා ප්‍රදේශවාසින් ප්‍රකාශ කරන බවත්, මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගැනිමට කටයුතු කරන්න කියා ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා ඉදිරිපත් කළ පාලම පළාත් සභා යෝජනාවලට ඉදිරිපත් කර ඇති බවත්, මේ පාර අඩි 8 ක පාරක් බවත්, දෙපැත්තෙ ඇදි ගැසුවොත් පාර පටු වන බවත්, ඒ නිසා මේ පාලම සංවර්ධනය කරන්න යෝජනාව ඉදිරිපත් කර ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප.ව 1.18 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

මුලික රෝහලේ එක්ස්රේ යන්ත්‍රය ක්‍රියාත්මක නොවීම සම්බන්ධව රෝගීන් අපහසුතාවයට පත් වී ඇති බවත්, හදිසි රෝගියෙක් ගිය විට එම රෝගියා රත්නපුර ගිහින් එක්ස්රේ ලබා ගෙන එන විට ඒ රෝගියාගේ රෝගය බරපතල වෙන්න පුලුවන් බවත්, ඒ නිසා ප්‍රදේශවාසින්ගේ වගේ ම ඇහැලියගොඩ ආසනයේ රෝගීන් සියලු දෙනාට ම ඇති වෙලා තියෙන ප්‍රශ්නයක් බවත්, මේ සම්බන්ධවත් කටයුතු කල හැකි ආයතනයක් සමඟ කතා කර ඒ දේ සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමඑක්ස්රේ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත්තේ ක්‍රියාකරුවෙක් නොමැති කම බවත්, එය රෝහල් කමිටුව සමඟ කතා කර බදවා ගැනීමේ පටිපාටිය හරහා විය යුතු බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 1.21 ට සභා ගර්භයෙන් පිට විය.

ඇහැලියගොඩ ආසනයේ කසල කළමනාකරණය ක්ලීන් ශ්‍රීලංකා වැඩසටහනත් සමඟ සම්බන්ධ වී එහි උපදෙස් අනුව කසල කළමනාකරණය සිදු වන බවත්, මෝරගල පාර සඳහා මාර්තු මාසය තුළ ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු

කරන බවත් මේ වර්ෂය තුළ වැඩ ආරම්භ කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කර තිබූ බව මීස මාර්තු මස පාර සාදනබව නොකිබවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මාර්තු මාසයේ ප්‍රතිපාදන වෙන් කර ගැනි මක් සිදු කළ බවත්, මිලියන 40 ක ප්‍රතිපාදනයක් ඇහැලියගොඩ ආසනයට ම ලැබුනු බවත්, එයින් මිලියන 20 ඒ සඳහා යොදවන බවත්, කොට්ටාහය කවුරු දිනුවද කියා අදාල නැති බවත් එය ඇහැලියගොඩ ආසනයේ ප්‍රධාන පාරක් බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

රටේ ආර්ථිකයේ තීන්දු තිරණ ගන්නා දේ මධ්‍යම ආණ්ඩුවෙන් සිදු කරන බවත්, ඔබතුමන්ලගේ කාලයේදීත් මේ ප්‍රශ්න ආ බවත්, මෙවැනි ප්‍රශ්නවලට සුදානම් විය යුතු බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සබාව මඟින් පවත්වාගෙන යනු ලබන පෙරපාසල් නොමැති බවත්, කලින් කුමක් හෝ තිනිදුවක් ගෙන එහෙම දෙයක් සිදු කර ඇත් නම් ඒ දේ සොයා බලන බවත්, අයවැය සකස් කිරීමේ දී එවැනි කාරනාවක් දැන ගැනීමට නොතිබුණු බවත්, ඇහැලියගොඩ ප්‍රාදේශිය සබා දේපලක පෙරපාසල් පවත්වාගෙන යනු ලබන්නේ නැති බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පුස්තකාල උපදේශක කාරක සබාවට අපේ සියලු මන්ත්‍රිවරු නියෝජනයක් විදිහට සභාපතිතුමා එහි නියෝජනය වන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ ගංවතුර තත්ත්වය, ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව විසින් අක්කර 45 භූමිය ආශ්‍රිතව වැව සකසන එක මේ වර්ෂයේ සිදු වන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 1.25 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මේ වන විට රටේ නීතිය හරියට ක්‍රියාත්මක වන බවත්, වැරදි කල අයට දඩුවම් ලැබෙන බවත්, එක දිගට නඩු කතා කරන බවත්, රෙට් ජනතාව ඉල්ලුවේ නීතිය හරියට ක්‍රියාත්මක කරන්න කියා බවත්, දැන් නීතිය හරියට ක්‍රියාත්මක වෙන බවත්, කලින් දේශපාලඥයාට හරියට නීතිය ක්‍රියාත්මක නොවූ බවත්, එක් පුද්ගලයෙක් නඩු 4 කට අවුරුදු 4 ක් සිරගත වන බවත්, ඒ නිසා රණවිරුවෝ කියා ලේබල් ගහපු ත්‍රස්තවාදින්ටත් අධිකරණ ක්‍රියාමාර්ග ආ විට නීතිය ක්‍රියාත්මක වන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරු හැටියට සැම වසරකට වරක් ම වත්කම් බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කල යුතු බවත්, ඊමේල් ලිපිනය හා දුරකතන අංකය මඟින් link එකට log වී මේ මස 30 වෙනිදට පෙර මෙය ඉදිරිපත් කළ යුතු බවත්, ඉදිපත් නොකළහොත් එය දඩුවමු ලැබිය හැකි වරදක් බවත්, ඒ සඳහා තාක්ෂණික සහයක් අවශ්‍ය නම් සබාවට පැමිණ සභාවේ

නිලධාරිතුමින්ගේ උදව් ලබාගෙන සිදු කළ හැකි බවත්, සභික මණ්ඩලයේ වට්ස්ඇප් සමුහයේ ඒ සඳහා අවශ්‍ය කරන උපදෙස් මාලාව ඉදිපත්කර ඇති බවත්, මෙ අනිවාර්යෙන් මෙය සියලු මන්ත්‍රීවරුන් කළ යුතු බවත්, මෙහි වරදකරු වුවහොත් ඉදිරියේදී ඡන්දය ඉල්ලිමට පවා නොහැකි බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අද දින පැමිණි සියලු මන්ත්‍රිතුමන්ට හා මන්ත්‍රිතුමියන්ටත්, ලේකම්තුමා ඇතුලු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත්, මාධ්‍යෙවිදී සියලු දෙනාටත් ස්තුතිවන්ත වන අතර. අද ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ 2026.06.09 වන දින සාමාන්‍ය සභා රැස්වීම මෙතැන් සිට නිමා කිරීමට කටයුතු කරන බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.06.09 වන දින සාමාන්‍ය සභා රැස්වීම 1.28 ට නිමාවට පත් විය.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ.....මස.....දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.